# දැයේ මාතා




3
ාඩ
ESIDENT'S
9. 548·7
ී ගො
IBRARY

ග්‍රාමාතෘ,

# සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක

# දැයේ මාතා



## අභිනන්දන ගීතය

දැය නිති පුබුදන දෑ මාතා
සෙත්සිරි ගරු අගමැති මාතා //
සිරිමාවෝ ලක ලෝකයෙ පූජිත
කිත්රැස පතුරා ගුණනැණ සපුරා//

දෙය්අභිමානය දෑ අනුරාගය //
දේශපාලනයේ නිපුණත්වය
උදාර දූ පුත් රුවන තනා

සෙත්සිරි ..................

වෙහෙර මහාදේවිය පොරණෝ //
නම දිනූ හෙළයේ සමවන්නේ
සමගියෙ මල්දම් පෙරමුණ අතුරා ////

සෙත්සිරි ..................

# දැයේ මාතා

## සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක ගරු අග්‍රාමාත්‍යතුමිය



සාමවිනිසුරු,

**පියසිරි පී. මීගොඩ (ධම්වායජී ගෞරව)**

*බටහිර සියනෑකෝරළේ විවාහ සහ බියගම කොට්ඨාශයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්*

වි. අ. ८४८०

२०००. ०६ ८७

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය
ප්‍රවේශ අංකය 2820
වර්ග අංකය 920

ප්‍රථම මුද්‍රණය
ශ්‍රී බුද්ධ වර්ෂ 2541 ක්වූ බක්මය
වර්ෂ 1998 ක්වූ අප්‍රියෙල් මස
තරංග සංජීව
ISBN 955-96378-1-9



| | |
|---|---|
| පරි. අංක | 2820 |
| වර්ග අංකය | 920 |
| දිනය | 2000.05.25 |



අනුග්‍රහය:
කැලණි සංස්කෘතික මණ්ඩලය

ප්‍රකාශනය
ප්‍රකාශන අංශය
සහන සේවා සංවිධානය
සපුගස්කන්ද

මුද්‍රණය:
පුබුදු ප්‍රින්ටර්ස්.
මාකොළ.

ජනාධිපති කාර්යාලයේ
පුස්තකාලය

ජනාධිපති ලේකම් කාර්යාලය
27 JUN 2000
පුස්තකාලය

දැයේ මාතා

ශිෂ්ප්‍රණාමය . . . . . . . .

මා හදගත් මා හිතවත් මා ගරුකරන හිදෙනෙකි. ආගමික, දේශපාලනික සහ සාමාජික වශයෙන් ඔවුන් ලෝ පසිඳුය. මා මෙන්ම ඔබත් ඔවුන්ට ගරුකරනු ලැබේ. කැලණිය රාජමහා විහාරාධිපති, අති පූජ්‍ය, ආචාර්‍ය්‍ය, කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමියෝ, දැයේ මාතා අතිගරු, සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමිය සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගරු සභාපති, සිරිල් හේරත් මැතිතුමා

වෙසෙසසින් සිරිලක් වාසීන්ට පොදුවේ වැඩදායක සේවාවන් ඉටුකරන මොවුහු ලොව ප්‍රකට වූයේ තානාන්තර නිසාම නොම, මානව හිත වාදී ආගමික, දේශපාලනික සහ සාමාජික උදර මෙහෙවර නිසාමය. **තනතුරු නිසා මොවුන් බැබලූනා නොව ඔවුන් නිසා දැරූ තනතුරු බැබලූනා මය.**

පොදු ජනතාවගේ අග්‍ර නායිකාව වශයෙන් සිරිමාවෝ නාමය සඳ හනිකය. අමරණීයය. එම අමරණීය නාමයට ලිඛිත ප්‍රණාමයක් දැක්වීම මගේ අභිලාෂය වන්නේය. එය ගරු ගැඹිමකින් ඉදිරිපත් කිරීමට මා දරණ තැන කෙතරම් දුරට සඵල වේදැයි මට කිව නොහැක. එසේ වුවත්, මම එම කටයුත්තෙහි නිරතවෙමි. එතුමියගේ 82 වන පින්වත් ජන්ම දිනයේදී මෙම ප්‍රණාමය දැක්වීමට ලැබීම භාග්‍යයක් සේම පලදුන් පෙර පිනැකැයි මට හැගේ.

**ගරු සිරිමාවෝ මාතාවෙනි,**
**මගේ ශිෂ්ප්‍රණාමය පිළිගන්න,**
**මෙයට, දැ හිතැති,**
**පියසිරි පී. මීගොඩ**

## සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ප්‍රථම කාන්තා අගමැතිණිය ලෙස මුළු ලොවම ප්‍රසිද්ධය. ඒ අනුව එතුමිය ගෙන් ලක් ඉතිහාසය පමණක් නොව ලෝක ඉතිහාසයද ඒකාලෝක වේ.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ශ්‍රී ලංකාවේ නායකත්වය භාරගත්තේ රට නොසන්සුන්ව පැවති අවධියකය. රටේ ආර්ථිකය මන්දගාමී මාවතක ගමන් කරමින් සිටි සමයකය. රටට දේශපාලන ස්ථාවරභාවය ළඟාකර ගැනීමටත් ආර්ථිකය ශක්තිමත් කඩිනම් මාවතකට ප්‍රවේශකිරීමටත් මැතිනියගෙන් සිදුවූ සේවය මෙතෙකැයි පමණ කළ නොහැකිය.

1948 පෙබරවාරි මස 4 වෙනිදින මෙරටට ලැබුණු නිදහස නාම මාත්‍රික දේශපාලන නිදහසක් වූ බව අපි දනිමු. එම දේශපාලන නිදහස සම්පූර්ණ කිරීමට එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරණායක අගමැති තුමාගෙන් වූ මෙහෙවරද මෙහිදී සිහියට ගත යුතුය. බ්‍රිතාන්‍යයට අයත් යුද කඳවුරු මෙරට තිබෙන තුරු දේශපාලන නිදහස අංග සම්පූර්ණ නොවන බව තේරුම්ගත් බණ්ඩාරනායක ශ්‍රීමතාණන් එම යුද කඳවුරු ඉවත් කොට දේශපාලන නිදහස වඩාත් අර්ථවත් කළ බව අපි දනිමු. සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණියද සිය ස්වාමියාගේ අඩි පාරේ යමින් ශ්‍රී ලංකාවේ ගෞරවය හා ස්වාධීපත්‍ය තහවුරු කරනු පිණිස පියවර කිපයක්ම ගත්තාය. ඉඩම් ප්‍රති සංස්කරණය මගින් විදේශිකයන් සතුව පැවති ශ්‍රී ලංකා භූමිය නිදහස් කර ගත්තේ එතුමියය. ජාතික අධ්‍යාපනයකට මග සළසමින් පාසැල් රජයට පවරා ගත්තේ ද එතුමියය. විදේශීය කොම්පැණි කාරයන් සතුව තිබූ ඉන්දන ආනයනය සහ බෙදාහැරීම රජය සතු කළේද එතුමියය. මෙබඳු පියවර රාශියක් ගෙන ශ්‍රී ලංකාවේ දේශපාලන නිදහස පරිසමාප්ත කළ එතුමිය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය විසින් අපට තිළිණ කළ සෝල්බරි ව්‍යවස්ථාව වෙනුවට ජනරජ ව්‍යවස්ථාවක් හඳුන්වා දෙමින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයටද මග පෑදුවාය.

**මේ අනුව සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය ශ්‍රී ලංකා ඉතිහාසයේ අමරණීය නාමයකි. ඇය මෙරටට කළ සේවය සදානුස්මරණීයය.**

දේශපාලනය වෙනුවෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය තරම් පරිත්‍යාග කළ තවත් දේශපාලනඥයෙකු ශ්‍රී ලංකාවේ නැත. දේශපාලනය නිසා ඇයට සිය ස්වාමියා නැතිවිය. සමීප නෑ හිත මිතුරන් නැතිවිය

පාරම්පරික ඉඩකඩම් නැතිවිය. අවසානයේ සිරිලක් බිම කම්පාවට පත් කරමින් එතුමියගේ සිවිල් අයිවාසිකම් නැතිවිය. මේ කිසිවකින් කම්පාවට නොපැමිණි ශ්‍රී ලංකා වාසීන්ගේ හිත සුව පිණිස අගිතව ඉදිරියට ගිය එතුමියට තුන් වරක්ම ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය පදවියට පත්වීමට හැකිවිය. එතුමිය කළ මහා පරිත්‍යාග අතර ජනපති පදවිය සිය දියණිය වන චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණියට පරිත්‍යාග කිරීමද සැලකිය යුතුය. එහෙක් බණ්ඩාරනායක මැතිණිය තවමත් පොදුජන පෙරමුණේ නායිකාවය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිණියය..

බණ්ඩාරනායක මැතිණිය ගැන ලියන මෙම සටහන එතුමියගේ ජාත්‍යන්තර දේශපාලන නායකත්වය පිළිබඳ සඳහනකින් තොරව කිසිසේත් සම්පූර්ණ නොවේ. නොබැඳි ජාතීන්ගේ සමුළුව ආරම්භ කිරීමේ පුරෝගාමී මෙහෙවරේ යෙදුණු බණ්ඩාරනායක මැතිණිය 1976 වර්ෂයේ පැවති නොබැඳි ජාතීන්ගේ සම්මේලනයේ මුලසුන දරමින් දේශපාලන ඉතිහාසයේ මස්තකප්‍රාප්තියට පැමිණිබව දැනුත් අපට සිහිවේ. සිරිමාවෝ බණ්ඩාරනායක යන නම ලෝවාසී ජනයා අතර ප්‍රකට වීමට බලපෑ හේතූන් අතර එතුමිය නොබැඳි සමුළුවට දුන් දායකත්වය විශේෂ වේ. බණ්ඩාරනායක මැතිණිය පිළිබඳව පී. බී. අල්විස් පෙරේරා කවියා ලියූ පැදිපද දෙකකින් මෙම කෙටි ලිපිය සමාප්ත කරමි.

'ජනතා සටන් මැද ජයකොඩි නැගූ අම්මා
ලක් අම්මාය අපගේ අග මැති අම්මා'

**මේ උදාර ජනතා නායිකාවගේ චරිතාපදානයෙන් බිඳක් නමුදු ලෝකයා හමුවේ තැබීමට, ප්‍රකට ලේඛකයෙකු මෙන්ම කවියෙකු වන පියසිරි පී. මීගොඩ වියතා ගත් තැනට කෘතවේදී හැමදෙනාගේම ස්තූතිය හිමිවිය යුතුය.**

**මහාචාර්‍ය, කුඹුරුගමුවේ වජිර හිමි**
**මහෝපාධ්‍යාය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.**
**1998 මාර්තු 01**

| පෙරමග | පිටුව |
|---|---|


| | |
|---|---|
| සූර්යෝදාව | 07 |
| ස්වර්ණමය දිනය | 09 |
| සුවිශේෂ චරිතය | 13 |
| යුග පෙරළිය | 17 |
| දැයේ මාතා | 21 |
| ශ්‍රේෂ්ඨ බෞද්ධ නායිකාවක් | 25 |
| පස්මහල් මන්දිරය | 29 |
| ලෝකයේ ප්‍රථම අගමැතිණිය | 35 |
| ලොව පළමු විරුද්ධ පක්ෂයේ නායිකාව | 38 |
| ජනරජය උදකළ ජන බලය | 43 |
| ජයග්‍රහණ | 51 |
| නොබැඳි රාජ්‍යනායක හමුව ශ්‍රී ලංකාවේ | 53 |
| ශ්‍රද්ධාභක්තිය | 57 |
| අථිපූර්ණ දේශනය | 61 |
| නිදහස් ස්වර්ණ ජයන්තිය | 65 |
| චිරං ජයතු | 68 |

**සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමිය සූර්යෝදව**

වර්ෂ එක්වාදහස් නවසිට දහසය වැන්නේ බක්මස දහසත් වෙනිද වෙනදටත් වැඩියෙන් ශෝභාසම්පන්නව හිරු උදවත් සමගින් ශ්‍රී ලංකා මාතාව හෙළයේ විරුවරිය බිහිකළාය. එදා මහවල තැන්න වලව්ව හෝ මහවල තැන්න වලව්වේ රටේ මහත්තයා හෝ සුවිශේෂ වූ පාරම්පරිකයන් හෝ මේ පින්වත් කුල කුමරිය දේශයේ අභිමානයට, ලොව පූජිත භාවයට පත්වේයැයි නොසිතන්නට ඇත. දේශයේ පිනට දෛවය පිටිවහළක් වූ සෙයින් පිපුණු පියුමේ රමණීයත්වයත්, සුගන්ධවත්බවත් සිරිලක සිසාරා විහිදුවන්නට විය. . . . . . . .

සිරිමාවෝ රත්වත්තේ පින්වත් කුමරිය සියළු යස ඉසුරින් ආඪ්‍යවූ මන්දිරයක සැපවත්ව වැඩෙමින් ඇගේ පියාණන්වූ බලංගොඩ බාන්ස් රත්වත්තේ දිසාවන්ට සහ මැණියන් වූ මහවලතැන්නේ කුමාරිහාමිට මිණි පහනක්ව සතුට සැපත ළගාකලාය. ඒ ඇය වැඩිමහල් වූ හෙයින්ය. ඇය අසීමිත ආදරයකට පාත්‍රවූවාය. ඇගේ සීයා මහවලතැන්නේ රටේ මහත්තයා එවකට මහත් කීර්තියක් දිනා සිටි ප්‍රභූවරයෙකි.

මෙරට ඉතාමත් ප්‍රකටවූ දුලබ පොත්වලින් සමන්විත වූ මාහැඟි පුස්තකාලයක් එතුමා පවත්වාගෙන ගිය බව ඓතිහාසික තොරතුරු හෙළිකරයි. බාන්ස් රත්වත්තේ රටේ මහතා දරුවන් සතර දෙනාටම එකලෙස යුතුකම් ඉටුකරමින් හොහොයුරන් තිදෙනාම විශ්ව විද්‍යාල අධ්‍යාපනයට යොමු කරමින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චය කරුවෙකු. සහ වෛද්‍යවරු දෙදෙනෙකු ශ්‍රී ලංකාවට දයාද කළේය.

ඊටත් වැඩියෙන් විශේෂ අවධානයක් යොමුකළේ අපේ කතානායිකාවටය. **ඇගේ මූලික අධ්‍යාපනය රත්නපුරේ පර්ගසුසන් උසස් පාඨශාලාවේදී ලබා ගත්තාය. 1924 ජුලි මස 13 දින සිට කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයේ උසස් අධ්‍යාපනයට යොමු වූ ඇය 1934 දෙසැම්බර් 30 දින දක්වා එහි සිප් සතර මෙන්ම බාහිර ක්‍රියාකාරකම් කෙරෙහිද යොමු වූවාය.**

**පොදු සේවා අඩිතාලම**

සිප්සතර මැනවින් අධ්‍යයනය කරමින් ඇය බාලදක්ෂ නායිකාවක්ද වූවාය. මුලින්ම එමගින් පොදුසේවා සඳහා අවතීර්ණ වූ ඇය ආදර්ශවත් ගෘහණියක් වීමේ අඩිතාලමද දැමූවාය. අද සමාජයේ මහා සමාජ සේවිකාවන්ගෙන් ඇත් වූ ගෘහ විද්‍යා විෂයය ඉතා කැමැත්තෙන් හැදෑරුවාය. **පොදු සේවා වෙත නැඹුරු වෙමින් මහිලා සමිති ව්‍යාපාරයටද එක්වූ ඇය එම ව්‍යාපාරයේ ලේඛිකා, භාණ්ඩාගාරිකා සහ සභාපතිණිය යන තනතුරුද හෙබවූවාය.**

## ස්වර්ණමය දිනය


**වර්ෂ 1940 ඔක්තෝම්බර් මස තෙවෙනි දින එතුමියගේ දිවියේ ස්වර්ණමය දිනය වූවාට සැකයක් නැත. සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක මැතිඳුන් සමග විවාහප්‍රාප්ත වීම එම සුවිශේෂ සිද්ධියයි.** බණ්ඩාරනායක පවුලේ ගමන් මගත් සිරිලක පොදුජනතා ගමන් මගත් මෙම සුභ සිද්ධියෙන් වෙනස් වූ වග තතුදන්නෝ පවසති. මොවුහු සඳඑතලයෙන් මිහිතලයට සපැමිණීම දුර්ලභ සිද්ධියකි. සමාජය ඉතා අගය කරන සැමඳ මෙනෙහි කරන සුවිශේෂ සිද්ධියකි. සමාජවාදී ගමන් මග දෙදෙනාගේම එකම ගමන් මග විය. ප්‍රියාදර එක්වීමකි. මෙම එක්වීම සූර්යයා හා චන්ද්‍රයා එක්වීමක් නැත්නම් රන්රස එක්වීමක් වශයෙන් එදින හිටපු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා හඳුන්වනු ලැබිය. එය එසේම විය.

## දේශීය ඇඳුම් පැළඳුම්


මෙම විවාහ මංගල අවස්ථාව කරුණු කිහිපයක් නිසා අතිශයින් වැදගත් වන්නේය. මනාලයාගේ ඇඳුම වූයේ ජාතික ඇඳුමය මෙම ඇඳුම මසන ලද්දේ වේයන්ගොඩ සාමාන්‍ය ඇඳුම් මසන්නෙකි. ඇඳුම සඳහා රෙදි වියන ලද්දේ එතුමා විසින් වේයන්ගොඩ පිහිටවූ පේෂකර්මාන්ත මධ්‍යස්ථානය විසින්ය. ආදර්ශය ආරම්භ විය. එය ඉහළින්ම පෙන්වන ලදී. එවකට එතුමා ශ්‍රී ලංකාවේ පළාත්පාලන අමාත්‍යවරයා බව අමතක නොකළ යුතුය. අද අමාත්‍යවරුනට මන්ත්‍රීවරුනට එතුමා එද දුන් ආදර්ශය නැවත මතක් කිරීම අවශ්‍ය වන්නේය.



සිරිමාවෝ ශ්‍රී සරණ මංගලයය



විවාහ රෙජිස්ටරයේ අත්සන් තැබීමෙන් යුවතිපති
සරණ බන්ධනය



අභිනව යුවළ කෝල්ඩ්කෝට් අග්‍රාණ්ඩුකාරතුමා විසින් පිළිගත් අවස්ථාව

**සුවිශේෂ චරිතය**

සිරිමාවෝ මැතිණිය ලෝක දේශපාලන ඉතිහාසයේ සුවිශේෂ චරිතයකි. ඇගේ ශ්‍රී නාමය අද්විතිය ස්ථානයක ලියැවී ඇත. සුපිරිසිදු ආදර්ශවත් දිවිපෙවෙතක් ගත කරන ඇය දේශපාලන වශයෙන් පරිණත බුද්ධියකින් හෙබියාවූ කුල කාන්තාවකි. ඇගේ පෞරුෂය බොහෝ අවස්ථා වලදී පුරුෂ පක්ෂය අභිබවා පැවති බව නොරහසකි.

**දේශපාලන නෞකාව**

දේශපාලනය යෝධ නෞකාවක් නම් එය පදවන්නේ ඇය නම් එහි ගමන් කරන්නන් ඇත්ත වශයෙන්ම සුරක්ෂිතය. එතුමිය හොටිල්ල පැදවීමට මෙන්ම දේශපාලන නෞකාව පැදවීමටත් නිපුණත්වයක් දක්වන්නිය. හොටිල්ල පදවන හස්තය ලොව ආණ්ඩු කරන්නේය යන මතය එතුමිය විසින් අර්ථයෙන් පමණක් නොව ප්‍රායෝගිකවද ඔප්පු කර ඇත.

**අපේ අම්මා . . . . . . . . . .**

**1997 සැප්තැම්බර් 26 වෙනිදින ජනපතිණිය මෙසේ කීවාය**

"පුරුද්දක් වශයෙන් මා කෑම කන්නේ ඉතා හෙමින්. අනෙක් අය කෑම කා අවසන්වී බොහෝ වේලා යන තුරුත් මම ඔහේ විකා විකා සිටිමි. **අම්මා කල්තියාම අනුරට කවා නින්දට යවයි.** ඉන් පසුව කෑම කා අවසන් වූ විගස අම්මාත් අක්කාත් නැගිට යති. තාත්තා මා කා ඉවරවෙන තුරුම පයිප්පය උරමින් කල්පනාවක වැටී සිටී."



අග්‍රාමාත්‍යතුමිය සමග ආදරණීය එකම පුතු අනුර බණ්ඩාරනායක ළමාවියේ

**චන්ද්‍රිකා බණ්ඩාරනායක ගරු ජනාධිපතිනිය 1997 වර්ෂයේ මහා බ්‍රිතාන්‍යයේ සංචාරයක යෙදී සිටියදී බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සේවය සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවකින් උපුටාගත් අදහස් ඒ අයුරින්ම මෙසේය.**

**පියා ඝාතනය කිරීම ඔබට මතකද?**

ඔව් සැම කෙනෙකුට වගේම මටත් දැනෙනවා. කොහොම වුනත් අපට හිතවතුන් සහ ඥාතින් බොහොම උපකාර කළා. පියාටත් මවටත් පෞද්ගලික මෙන්ම දේශපාලන වශයෙන්ද මිතුරන් හිටියා අමාරු අවස්ථාවලදී මට ඔවුන්ගෙන් ලැබුණු පිටිවහළ අපමණයි.

**ඔබගේ මවගේ ප්‍රභූත්වය ඔබට මහත්සේ මාර්ගෝපකාරී වූවා නොවේද?**

ඔව්.

**ලෝකයේ ප්‍රථම රාජ්‍ය නායිකාව හැටියට ඇය තේරී පත්වුණා. ඇයගේ අඩිපාරේ යාමට ඔබට අවශ්‍යතාවයක් විද?**

ඇත්තම කියනවා නම් දේශපාලනයට මගේ ලැදියාවක් තිබුනේ නැහැ. ඒ කියන්නේ මගේ මව සහ පියා දේශපාලනය කෙරෙහි බැඳී සිටි ආකාරය දැකල. ඒ අය දේශපාලනයෙන් ගම්බ නොකරපු ටිකදෙනාගෙන් කොටයක්. 1972 මගේ අම්මා දෙවන වරට අගමැතිවූ අවස්ථාවේදී ගෙනා නීතියක් යටතේ තමයි විශාල වශයෙන් ඉඩම් රජයට පවරා ගත්තේ. අපේ ඉඩම් අක්කර දහස් ගණනින් රජයට පැවරුණා. ඒක අපට ප්‍රශ්නයක් වුනේ නැහැ. නමුත් සමහරු කෝපයෙන් ශාපකළා.

**ඔබගේ මව මාවෝ වාදිනියක් ද?**

නැහැ.

**ඇගේ දේශපාලනය කුමක්ද?**
ඇත්තෙන්ම ඇය බොහොම ප්‍රායෝගික කාන්තාවක්.

**ඔබටත් ඔබේ මවටත් මුහුණපෑමට සිදුවූයේ එකම විදියේ සිද්ධීන්වලටයි. එයින් ඔබ වඩාත් මව් වෙත සමීපවුණා.**
ස්ථිර වශයෙන්ම

**අපේ අම්මා**

**පුත් අනුර බණ්ඩාරනායක මන්ත්‍රීතුමා 1997 දෙසැම්බර් මස අටවෙනි දින පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශයකින් කොටසක්....................**

"අගමැතිතුමිය ඉල්ලා අස්වීමට යන බවට කතා පැතිර ගියා. මා රයේ එතුමිය මුණ ගැසුනා. එතුමිය අගමැති පදවිය අතහැර නොයන බව සහතික වශයෙන්ම කිවා. එතුමිය දීර්ඝකාලයක් මේ තනතුරේ කටයුතු කරනවා ඇති.

අගමැති පදවිය අපේක්ෂාවෙන් සිටින අයට තව බොහෝ කලක් බලා සිටින්නට සිදුවේවි"

**හොඳ අගමැතිණිය**

"මා සටන් බිමට යන්නේ මේ යුද්ධය මෙහෙයවන්න මිස අගමැතිකම ගන්නා හිතාගෙන නොවන බවත්, පුවත්පත් වලින් භේද ඇතිකිරීමට උත්සහ කළත් අප අතරේ කිසිම භේදයක් නොමැති බවත්, **අපට හොඳ අගමැතිණියක් පදවියේ සිටින බවත් වාරිමාර්ග විදුලිබල අමාත්‍ය සහ රාජ්‍යරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය, ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා 1998 ජනවාරි හයවන දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේය.**

## යුග පෙරළිය

1956 වර්ෂයේ ඓතිහාසික ජනතා යුගයේ පරිවර්තනය පසුපස සිටි දැවැන්ත නායිකාව එතුමිය වූවාය. මෙම බලවේගය තුළින් භාෂාව සිරිත් විරිත් දේශපාලනයට කාවැද්දීමට එතුමිය ක්‍රියාකළ ආකාරය පැසසුම් කටයුතුය. **හොරගොල්ලේ වලව්වේ ගැම්බේකන් වෙනුවට කිරිබත් පිසුනේ එතුමියගේ අවශ්‍යතාවය මතය.** ගැමි පරිසරය විසින් ඉහළ පාන්තික ස්වරූපය මැඩ පැවැත්වීමට එතුමියු තරම් ඇප කැපවූ කාන්තාවක් එවකට නොවීය. පොදුජනතාවගේ ආශිර්වාද මධ්‍යයේ ආගන්තුක සත්කාර පමණක් නොව තම දයාබර ස්වාමිපුරුෂයාණන්ගේ අවශ්‍යතාවයන්ද දරුවන්ගේ ඕනෑඑපාකම් ද නිසිලෙස ඉටුකරමින් කීර්තිමත් ජන නායකයාණන්ට ස්වකීය දේශපාලන කටයුතු විඩිමත්ව මානසික පීඩනයකින් තොරව ඉටුකිරීමට පහසුකම් සැලසීම එතුමියගෙන් ඉටුවිය. එය මැනවින් ඉටුවීම ජාතියේ ද භාග්‍යයක් විය.

**අවාසනාවන්ත සිද්ධිය**

සියල්ල සිතූ පැතූ අයුරින්ම ඉටු නොවීම ලොව දහමතාවයකි. එම සිද්ධිය එතුමියගේම වචන වලින් එළිදරව් කිරීම ශෝකය දනවන කරුණකි. එහෙත් මා එ සටහන් කළ යුතුය.

**"1959 සැප්තැම්බර් 25 වෙනිද උදේ අප නිවසේ පත්තුවූ සාහසික වෙඩි උණ්ඩ කිහිපයේ හඬ මට හොඳට මතකය. පසුදින උදේ සුරතල් දරු තිදෙනාත් මාත් මගේ දයාබර සැමියාගෙන් සදහටම වෙන් කළේ ඒ මාරක වෙඩි උණ්ඩ කිහිපයයි. අවුරුදු දහනවයක් මම එතුමා සමග ජීවත්වීමි.**

**ප්‍රගතියේ සතුරෝ**

ප්‍රගතියේ සතුරෝ එතුමා මරා දැමූහ. ප්‍රතිගාමීත්වයට විරුද්ධව ප්‍රගති කඳවුර වෙනුවෙන් එතුමා මෙහෙයවූ සටනේ දී එතුමා දිවි පිදීය. සටන එයින් කෙළවර නොවිය.

ප්‍රතිගාමීත්වය සදහටම අතුගා දමා සමාජවාදයේ ජයග්‍රහණය තෙක් එම සටන මෙහෙයවීමේ උතුම් කර්තව්‍ය ඉටුකිරීමට පොදුජනතාව විසින් මා වෙත පවරා ඇති වගකීමකි.

එතුමිය එසේ ප්‍රකාශ කළේ මීට දහහත් වසරකට පෙරය.

**දේශපාලනයට පෙළඹවීම සහ පෙළඹීම**

පොදුජනතා නියමුවාණන් සාහසික මරණයට බිලිවූ අවස්ථාවේ මේ රට ඉදිරියට ගෙනයාමේ කටයුත්ත කළ හැක්කේ කාටදැයි මුළු රටම විමසිලිමත් විය. එම ශෝචනීය අවස්ථාවේදී වුව සිරිමාවෝ මැතිණිය රට වෙනුවෙන් ද කම්පාවෙමින් සිටියාය. එතුමිය රට වෙනුවෙන් එම අවස්ථාවේදී ඉදිරිපත්වීම රටේ වාසනාව විය.



ශ්‍රීමත් බණ්ඩාරනායක අවමංගල අවස්ථාවේදී, සිරිමාවෝ දූ දරුවන් හා ඥතීන් සමග පැන්වඩන ශෝචණීය ආකාරය

මෙම රටේ වාසනාව පෑදීමට ඉමහත් සේවයක් බද්යුදීන් මොහමඩ් මැතිතුමාගෙන් සිදුවූ බව එවකට පාර්ලිමේන්තුවේ හිටපු මහ ලේකම්, සැම් විජේසිංහ මහත්මා හෙළිදරව් කර ඇත. බද්යුදීන් මොහමඩ් මහතා නිව්යෝර්ක් නුවර සිට දීඝී ලිපියක් එවමින් එතුමියට විශේෂ ආරාධනාවක් යග කරුණු ඉදිරිපත් කිරීමක් කළ බව සඳහන් වේ.

ඒ ලිපිය මා ළඟ තවම සුරැකිව තිබෙනවා. තවමත් ඇතැම් වෙලාවට මා එය රැගෙන කියවනවා. එය මට කිසිදිනෙක අමතක වන්නේ නැහැ" එතුමිය එයේ ප්‍රකාශ කළ බවද සඳහන්ය.

## නව දේශපාලන යුගයක උදව

නව දේශපාලන යුගයක උදව පිළිබඳව 1971 දී කරුණු දැක්වූ එවකට පක්ෂයේ උපසභාපති, අධ්‍යාපන අමාත්‍ය බද්යුදීන් මහමුද් මැතිතුමා විසින් කරන ලද ප්‍රකාශයක වැදගත් කරුණක් මතුකර දැක්වීමට අදහස් කළෙමි.

"බණ්ඩාරනායක මහතා විසින් ආරම්භ කරන ලද වැදගත් කාර්‍යයන් ඒ ගැටියෙන්ම දිගටම කරගෙන යාමට ඉඩ නොදෙන ලදී. සාහසිකයෙකුගේ කෲර අතක් එතුමා දේශපාලන කරළියෙන් ඉවතට ඇද දැම්මේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අවසන් වී යැයි ප්‍රතිගාමීහු උදන් ඇනුහ. පක්ෂ නායකත්වයට දක්ෂයෙකු නොපැමිණියේ නම් ඔවුන්ගේ අදහස් ඉටුවීමට ඉඩතිබිණි. මේ අර්බුදයේදී ජනතාව වර්තමාන ගරු අගමැතිනී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ සහාය පැතුහ. පරිත්‍යාගශීලී හැඟීමකින් යුතුව එතුමිය ජනතා හඬට කන් දුන්නාය. ධෛර්‍යවත් ලෙස ඉදිරිපත්වූ එතුමිය අභිමානවත් ලෙස පක්ෂනායකත්වයට උර දුන්නාය. ජනතා කෘතඥතාවය නොවළහා පළවිය."


## දැයේ මාතා

මෙම කරුණාටම අදාළව විද්‍යාලංකාර පරිවේණාධිපති, අතිගරු, වැලමිටියාවේ කුසලධම්ම නාහිමියන් විසින් එතුමියගේ 81 වෙනි ජන්මදින සමරුපින්කමක් පැවැත්වූ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේදී කරන ලද අජීවත් දෙසුම සඳහන් කිරීම මැනවැයි සිතිණ.

රටට ජාතියට ආගමට ආදරයෙන් තමන්ගේ ජීවිතයේ දී මුහුණ දුන් දුක් ගැහැට සහ කරදරවලින් නොසැලී ක්‍රියා කළ නිසා හැම දෙනාගේම මව ලෙස අප රටේ ජනතාව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට සළකනවා. අගමැතිණිය තරම් ප්‍රශ්න සහ ගැටළුවලට මැදිවී ඉන් ජයගත් කාන්තාවක් ගැන සිහිම පවා උගහටය. ඒ හැම අවස්ථාවකම එතුමිය නොසැළී සිටියාය. දේශපාලන සතුරන් විසින් කළ හැකි හැම පීඩාවකට මෙන්ම රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණවලට පවා මුහුණ දී නොසැලී සිටි එතුමිය ඉන් ජය ගත්තාය.



දැඩි සිතිවිල්ලේ........................ දූ දරුවන්ද ? දේශයද ?



රට වෙනුවෙන් කැපවීම..................... තිර අදිටන

එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ හදිසි අභාවයෙන් පසුව රට මොන අතට ගමන් කරයිද කියා කිසිවෙකුටත් හිතාගන්නට බැරිවුනා. නිදහස ලබාගන්නට පවා අඩිතාලම දැමූ එතුමාගෙන් පසුව මේ රට ඉදිරියට ගෙන යන්නේ කව්රුන්ද්‍රැයි කියන ප්‍රශ්නය එද ඇතිවුනා. ඒ අවස්ථාවේදී අගමැතිණිය ජනතා සේවයට ඉදිරිපත් වුනා. අද දක්වාම එතුමිය ජනතාව සමග ජීවත් වෙමින් ජනතාවට සේවය කරනවා.

## දේපළ

අගමැතිණිය තරම් සාර්ථක දේශපාලන ජීවිතයක් ගත කළ අයෙකු තවත් නැහැ. එතුමිය දේශපාලනය රැකියාවක් ලෙස කලේ නැහැ. තම පරම්පරාවේ දේපළ පවා දේශපාලනය වෙනුවෙන් කැපකළා. සාමාන්‍ය අයෙකු බවට පත්වුනා. එසේ කළ දේශපාලනඥයෙකු ලංකාවේ නැහැ. එතුමිය මේ රටට සාමය සමාදානය ඇති කිරීමට කටයුතු කළා. රටට ජනතාවට සේවයක් වන අන්දමට තම දරුවන් පවා හැදුවා. ඒ අතින්ද එතුමියගේ ජීවිතය සාර්ථකයි. එතුමිය විවිධ දේශපාලන මති මතාන්තර දරන අය සමග රට පාලනය කළා. වත්මන් ජනාධිපතිණිය පවා ඒ අනුව යමින් විවිධ මති මතාන්තර දරන්නවුන් සම්බන්ධ කරගෙන රට පාලනය කරනවා. එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැති තුමාගෙන් පසුව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය රට බාර නොගත්තා නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෝඩ් ලෑල්ලට සීමා වෙනවා. පක්ෂයේ හැම එතුමියට ණයගැතියි.

**ශ්‍රේෂ්ඨ බෞද්ධ නායිකාවක්**

සිරිමාවෝ මැතිණිය ශ්‍රේෂ්ඨ බෞද්ධ නායිකාවක් වශයෙන් එදින සමරු පින්කමේදී විශේෂ දේශනයක් කළ **විද්‍යෝදය පරිවේනාධිපති, රාජකීය පණ්ඩිත අකුරැටියේ අමරවංශ නාහිමියෝ හඳුන්වාදුන්හ.**

"රත්වත්තේ පරම්පරාව මේ රට නොයෙක් වර බේරා ගත්තා. දැනට උඩරට ඉතිරිව සිටින්නේ රත්වත්තේ පවුල විතරයි. අද පමණක් නොව අනාගතයේදීත් මේ රට පාලනය කිරීමේ වාසනාව රත්වත්තේ පවුලට තියෙනවා. සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය මෙරට පමණක් නොව ලොව පුරා ගෞරවයට බඳුන් වූ ශ්‍රේෂ්ඨ බෞද්ධ කාන්තාවක්"

**භාෂාව**

**දැයේ භාෂාව පිළිබඳ එතුමියගේ අකලංක හැඟීම මෙසේ කැටිකර දැක්විය හැකිය.............**

භාෂාව ඕනෑම රටක පිවත්වන ඒ ඒ ජන කොට්ඨාශයන්හි අනන්‍යතාවය හා සංස්කෘතික ලක්ෂණ පෙන්නුම්කරණ වැදගත්ම සාධකයක් ලෙස සැලකේ.



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

අප රටේ බහුතරයක් වූ සිංහල ජනතාවගේ භාෂාව සහ එහි විකාශයට දීර්ඝකාලීන ඉතිහාසයක් ඇත. සියළුම ලේඛක භවතුන්ගේ වගකීම විය යුත්තේ සාමය සහ යහපැවැත්ම අරමුණු කොට ජනතා සිත්සතන් අවදිකිරීමේ හා යහපත් සමාජයක් ගොඩනැගීමේ කාර්යභාරය ඉටුකිරීමේ හා යහපත් සමාජයක් ගොඩනැගීමේ කාර්යභාරය ඉටුකිරීමට සිය හැකියාවන් පෙන්නුම් කිරීමයි. භාෂාවේ දියුණුව එවිට නිරායාසයෙන්ම ඇති වේ.

භාෂාව සහ ලේඛක වගකීම පිළිබඳ මහා ග්‍රන්ථයකින් ලිවිය යුතු කරුණු එහි අඩංගු වී ඇතැයි මට සිතේ. දැන් අපි 1960 ජුලි මහ මැතිවරණය දෙසට හැරෙමු. එද එතුමිය කළ මා හැඟි ප්‍රකාශ එදට මෙන්ම අදටත් ගැලපෙන බව මගේ හැඟීමයි.

**අගනුවරදී..........**

'**මා සටන් කරන්නේ දුප්පතුන් ගලවා ගැනීමටයි.** අගමැතිවීමේ බලාපොරොත්තුවක් මා තුළ නැහැ. ඉදිරියට තැබූ පය ආපසු ගන්නේ නැහැ.

**කන්ද උඩරටදී..........**

'**දරුවන් රටට බාරදී සැමියා ගිය මග යමි.** මගේ එකම පරමාර්ථය රටට සේවය කිරීමටයි. මැරවරකම් මැඩලන්නට සාමකාමීව ඉන්න. **ගැහුමට ගහන්න එපා.** මා දේශපාලන සටනට බැස්සේ මගේ සැමියා රටට කළ සේවය වැනසීමට ප්‍රතිගාමීන්ට ඉඩ දෙන්ට බැරි නිසයි.'

**ඓතිහාසික කැලණිපුරවරයේදී............**

මගේ සැමියා 1956 දී ධනබලය බින්ද. දුප්පත් ජනතාව ඒ ලැබූ ජයග්‍රහණය ආරක්ෂා කොටදීම මගේ පරමාර්ථයයි. **ගඟක් ආපසු ගලන්නේ නැහැ. කැලණි ගඟත් එහෙමයි. 1956 ඉදිරියට ආ මහජන බලවේගය ආපසු ගමන් කරන්නේ නැති බව සහතිකයි.** මියගිය සැමියා ජීවත්ව සිටියදී ගෙනගිය ප්‍රතිපත්තීන් හා වැඩපිළිවෙල ඔහුගේ ආදරණීය බිරිය වශයෙන් රැකීමත් ඉදිරියට ගෙන යාමත් වරදක්ද?'

එය වරදක් නොවීය. කැලණි ගඟ ආපසු ගැලුවේත් නැත. ඉදිරිපත් කළ අපේක්ෂකයන් 98 දෙනාගෙන් 75 දෙනෙක්ම ජයග්‍රහණය කළහ. එය දේශපාලන වාර්තාවක්ද විය. ලෝක වාර්තාවක්ද පිහිටුවමින් එතුමිය ලෝක නායිකාවක් ද වූවාය. සිංහලේ මහකවි, පී. බී. අල්විස් පෙරේරා කිවිඳුන් 1965 වර්ෂයේ දිවංගත බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ට උපහාර පිණිස ලියන ලද පද්‍යපංතියකින් උපුටාගත් පද්‍ය දෙකක් ඔබට සිහිපත් කරනු කැමැත්තේමි.

යුතු කම් කොටස වෙනුවෙන් දිවියෙහි බාර
නතු වී ලබාගත් පසුවට වෙඩි පාර
උතු මෙක් වී රටේ පොදු ජනගා වීර
එතු මන් නමට වේවා මගේ උප හාර

සතු රගෙ හිසට පයදී පොදු ජන යාගේ
නතු කළ නමුදු රට දවසක බල වේගේ
අතු ගා ඔවුන් මැතිණිට තැනදී ඇගේ
උතු මා දිනේවා මහ දෙවියෙකු වාගේ

1965 සැප්තැම්බර් 25 දින විශේෂ ප්‍රකාශයක් නිකුත් කරමින් බණ්ඩාරනායක පිළිවෙත අනුව ප්‍රගතිශීලී සමගිය ඔස්සේ ගමන් මග විස්තර කළ සිරිමාවෝ මැතිණිය මෙසේ පළකළාය.

1956 දී සියළුම ප්‍රගතිශීලි දේශප්‍රේමී කොටස් සමග මැතිවරණ සටන මෙහෙයවා එතුමා විසින් ප්‍රතිගාමී අගතිගාමී දනපති පන්තිය බලයෙන් පහකොට දුප්පත් ගොවි කම්කරු ජනතාවට අයිතිවාසිකම් ලබා ගත හැකි රජයක් පිහිටුවන ලදී. ඒ ජයග්‍රහණය නිසා මේ රටේ සමාජයෙන් කොන්වී සිටි පුරවැසියන්ට හිමි නියම අයිතිවාසිකම් ලබාගැනීමට නොහැකිව අසරණව සිටි ලක්ෂ සංඛ්‍යාත ජනතාවට ලැබුණු අස්වැසිල්ල සුළුපටු නොවේ.

කොටින් කියතොත් ධනපති ප්‍රතිපත්ති ඇති දේශපාලන පක්ෂවල සහ පුද්ගලයන්ගේ ග්‍රහණයෙන් මිදී නිදහස් හිරු එළියෙන් ස්වකීය ජීවිතවලට ආලෝකය ලබාගෙන දුක්විඳින ජනතාව අනාගතය පිළිබඳව ඒකාන්ත බලාපොරොත්තු ඇතිකර ගැනීමට අවස්ථාව සළසා ගත්තේ බණ්ඩාරනායක අගමැති නිසා බව කව්රුනුත් පිළිගෙන අවසානය.

ඒ සමගම එතුමා මේ රටේ දේශපාලන භූමියේ කිසියම් නිශ්චිත බෙදීමකට මග පෑදූ අතර එයින් දුප්පත් ගොවි කම්කරු ජනතාවගේ සටන පිළිබඳව ඒකාන්ත තත්වයක් ඇතිවූ බව අප මෙහිදී අමතක කළ යුතු නොවේ. එක් අතකින් ධනපති ප්‍රතිපත්ති ඇති පුද්ගලයන් සහ දේශපාලන පක්ෂත් අනිත් අතින් ප්‍රගතිශීලී ප්‍රතිපත්ති ඇති දේශපාලන පක්ෂත් කඳවුරු දෙකකට බෙදී සටන් කිරීම නොවැලැක්විය හැකි සිද්ධාන්තයක් බව එතුමා පිළිගෙන සිටි බව එතුමාගේ ක්‍රියාවලින්ම අපට පැහැදිළි වෙයි.

අවාසනාවකට මෙන් එතුමාගේ 6 වන ගුණානුස්මරණ උත්සවය පැවැත්වෙන මේ අවස්ථාවේදී නැවත වරක් ධනවාදී අගතිගාමී කොටස් බලය අල්ලාගෙන 1956 දී ගරු බණ්ඩාරනායක අගමැතිතුමා විසින් ජනතාවට භාෂාව අතින් ආගම අතින් සංස්කෘතික අතින් සහ ආර්ථික සාමාජික අංශවලින් ලබාදුන් ජයග්‍රහණයන් පස්සට තල්ලුකොට විදේශික හා ස්වදේශික ධනවාදී අගතිගාමී කොටස්වල බලය තහවුරු කිරීමට ඉතා සියුම් ලෙස ක්‍රියා කර ගෙන යති.

එම නිසා ප්‍රතිගාමී අගතිගාමී මහජන විරෝධී සහ සමාජවාදය යන වචනයෙන් ජනතාව මුලාකරන්නට උත්සහ කරන එම බලවේග පරාජය කොට නැවත වරක් ජනතාවට නියම ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදය අනුව මහජන රජයක් පිහිටුවීමට අවස්ථාව ලබාගැනීම සඳහා සියළුම ප්‍රගතිශීලී කොටස් සමගි බැම්මෙන් බැඳී ක්‍රියාකළ යුතු මොහොත ළගාවී ඇති බැව් පවසනු කැමැත්තේමි.

සමාජවාදී බණ්ඩාරනායක ප්‍රතිපත්තිවලට ජයවේවා

## පස්මහල් මන්දිරය

**1971 සැප්තැම්බර් මස දෙවන දින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පස්මහල් මහ මැදුර සඳහා මගුල් ගල් තැබීම සිදුවුයේ අගමැතිනි අතිනි.** ශුභ මොහොතින් සිදුවූ මෙම අවස්ථාව අතිශයින් වැදගත්ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විසිවසර පිරිමද මෙදිනට යෙදුණු අවස්ථාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව වශයෙන් ජනතාව අමතා නිකුත් කරන ලද පණිවිඩයෙන් කොටසක් මෙහි පළකරමි. එමගින් ඓතිහාසික තොරතුරු රාශියක් ඉතා පැහැදිලිව එළිදරව් වේ.

අද දින තරුණ වියට පා තබන අප පක්ෂය විසින් ස්වකීය ළදරු අවස්ථාවේදීම ජනතාව වෙනුවෙන් කරන ලද සේවය සහ ලබන ලද විජයග්‍රහණයන් ආදියද අනාගතයේදී කිරීමට සැලසුම් කර තිබෙන සේවාවන් ගැනද මම මෙහිදී දීර්ඝව සාකච්ඡා කිරීමට අදහස් නොකරමි.

1951 සැප්තැම්බර් දෙවෙනි දින කොළඹ නගරසභා ශාලාවේදී බණ්ඩාරනායක මැතිතුමාගේ ඒකීය ප්‍රයත්නයෙන් බිහිකළ මෙම පක්ෂය ගැන යමක් වාර්තාගත කිරීමේදී එතුමාට මෙම පක්ෂය ආරම්භ කිරීමට හේතුගුතවූ කරුණු ගැන ද ලුහුඬු විස්තරයක් කිරීම අයෝග්‍ය කියා මම නොසිතමි.

## සිංහල මහා සභාව

අමධ්‍යප ව්‍යාපාරයෙන් ආරම්භ වූ මේ රටේ නිදහස් සටනේ පෙරමුණ ගත් සෙනෙවියන් අතර බණ්ඩාරනායක මහතාටද හිමිවන්නේ පළමු ස්ථානවලින් එකකි. එවකට මේ රටේ විද්‍යාමානවූ දේශපාලනමය සංවිධාන අතුරින් බලගතුම සංවිධානය වූයේ බණ්ඩාරනායක මැතිතුමාගේ සභාපතීත්වයෙන් සහ එතුමාගේ මග පෙන්වීමෙන් ආරම්භ කර තිබුණු සිංහල මහා සභාව විය. ලංකා ජාතික සංගමය වැනි වෙනත් දේශපාලන පක්ෂ කැඩී බිඳී දුවීල වී තිබුණු අතර විදේශවලින් ණයට ගත් ප්‍රතිපක්ෂ අනුව සකස් වූ වෙනත් පක්ෂ ජනතාව පිළිගැනීමට සූදනම් නොවිය.

## මාදම්පා සමුළුව

ශතවර්ෂ ගණනාවක් තිස්සේ නොයෙක් පීඩාවන්ට භාජනය වී තිබුණු අප ආගම භාෂාව කලා ශිල්ප දේශීය වෛද්‍ය විද්‍යාව සංස්කෘතිය ආදිය වැඩිදියුණු කර ජාතික දේහය පුෂ්ඨිමත් කරනවා වෙනුවට ඒවා පරිහානියෙන් පරිහානියට යන්ට ඉඩදී බටහිර සංස්කෘතිය රෝපණය කිරීමට ඔවුන් සූදනම් වන බව එතුමාට පෙනිණි. විදේශීය ධනවාදීන්ට සහ ස්වදේශීය ජාවාරම් කාරයන්ට අපගේ නිදහස් දිවයින කදිම ක්ෂේම භූමියක් බවට පත් විය. නිදහස යන්න සාමාන්‍ය ජනතාවට වචන මාත්‍රයක් පමණක් බවට සීමා වූ අතර ධනවාදී කණ්ඩායම් වලට නම් ගසා කෑමේ සම්පූර්ණ නිදහස හිමි වී තිබිණ.

එක්සත් ජාතික පක්ෂයේ ඒකකයක් වුවත් ස්වාධීන සංවිධානයක් වූ සිංහල මහා සභාව මාදම්පා සම්මේලනයේදී ජාතික වශයෙන් ඉතා වැදගත් යෝජනා මාලාවක් සම්මත කර රටේ සහ ජනතාවගේ ශුභසිද්ධිය සඳහා ඒවා ක්‍රියාත්මක කිරීම පිණිස එක්සත් ජාතික පක්ෂ නායකයා වූ බ්‍රිතාන්‍ය මහ රැජිනගෙන් මහාමාන්‍ය පදවියක් ලබා සිටි එවකට ලංකා අගමැති ඩී. ඇස්. සේනානායක මහතා වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ වටිනා යෝජනාවලියට ඒ මහතාගේ පිළිතුර වූයේ ඒවා ක්‍රියාත්මක කරනවා තබා සළකා බැලීමටත් කළ නොහැකි බවය. එයට පසුව ඒ ගැන නැවත වරක් සිතාමතා සළකා බලන ලෙස ඉල්ලා සිටීම සඳහා ඩී. ඇස්. සේනානායක මහතා හමුවූ සිංහල මහා සභාවේ නියෝජිත පිරිසක් කියා සිටිමුත් ඔවුන්ට ලැබුණේද ඉහත සඳහන් සළකා බැලීමටවත් බැරිය යන පිළිතුරමය.

මේ උච්ඡ අවස්ථාවේදී බණ්ඩාරනායක මැතිතුමාට කළ හැකි එකම දෙය නම් ස්වකීය බලගතු පදවි ජනතාව වෙනුවෙන් ඉවතට දමා ජනතාව සමග එක්වීමය. පසුදිනම තමා දැරූ පදවිවලින් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ආණ්ඩුකාර වරයාට භාරදුන් එතුමා එක්සත් ජාතික පක්ෂයෙන්ද ඉවත්ව ජනතාවගේ කැමැත්ත පරිදි විරුද්ධ පක්ෂයේ ආසනයක් ගත්තේය.

සිංහල මහා සභාව ආරම්භයට පෙර සිටම බණ්ඩාරනායක මැතිතුමාගේ අඩිපාරේ යමින් එතුමාගේ දේශපාලන ප්‍රතිපත්ති අනුගමනය කළ එතුමා සහ එතුමාගේ සිංහල මහා සභාව නිසාම වගකිව යුතු ඇමති උප ඇමති පදවි සහ මන්ත්‍රීධුර දරමින් සිටි රාශියක් එතුමා සමග විරුද්ධ පක්ෂයට යනවා ඇත කියා ජනතාව බලාපොරොත්තු වූ නමුත් බලගතු පදවි නොතිබූ කීප දෙනෙකු හැර සෙසු අය එදින එතුමාට ද්‍රෝහී වීමෙන් ඔවුන්ගේ වත්තපත්වය පෙන්වූහ.

1951 ජුලි මස 12 දින එක්සත් ජාතික පක්ෂයෙන් සහ තමා දැරූ උසස් ඇමති පදවි සහ පාර්ලිමේන්තුවේ සභානායක පදවියෙන් ඉවත්වී ගිය එතුමාට අනාගතයේදී ඇතිවිය හැකි බැරෑරුම් සහ කම්කටොළු සහිත කාලය ගැන ද දර්ශණය විය.

### පක්ෂයේ ආරම්භය

ජනතාව අතරට ගිය බණ්ඩාරනායක මහතා තමා සමග විරුද්ධ පක්ෂයට ගිය මන්ත්‍රීන් එක දෙනාත් එවකට විරුද්ධ පක්ෂයේ සිටි මධ්‍යස්ථ මතධාරී කිහිපදෙනෙකු සහ සමාජවාදී මත දරන පිටස්තර කණ්ඩායම් සමග එකතු වී ජනසම්මත සමාජවාදී පක්ෂයක් ඇරඹීමේ කටයුතු පටන් ගත්තෝය. මෙම මධ්‍යස්ථ මතධාරී කණ්ඩායමේ තීරණය අනුව **1951 සැප්තැම්බර් 2 වෙනි දින කොළඹ නගර සභා ශාලාවේදී දසදහස් සංඛ්‍යාත නානා ලබ්ධික, නානා ජාතික, ජනතා ප්‍රීතිඝෝෂා මධ්‍යයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පටන් ගනු ලැබීය.**

### 1956

1956 දී පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. ඒ වන විට මහා මැතිවරණයකට මුහුණ දීමට ප්‍රගතිශීලී කණ්ඩායම් සම්පූර්ණයෙන්ම සූදානමින් සිටියහ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන ප්‍රගතිශීලී පක්ෂ මහජන එක්සත් පෙරමුණ නමින් පෙරමුණක් සැදී එක්සත් ජාතික පක්ෂයට මුහුණ දීමට ඉදිරිපත් විය.

භාෂාව, ආගම, දේශය, වෛද්‍ය විද්‍යාව, ජාතික කලාශිල්ප, ආදියට නියම ස්ථානය දෙමින් ජනසම්මතවාදී සමාජවාදයක් ගොඩනැගීමේ පවිත්‍ර චේතනාව ඇතිව සිටි බණ්ඩාරනායක මහතා රටේ අස්සක් මුල්ලක් නැර යමින් තමාගේ පක්ෂයේ ප්‍රතිපත්ති ජනතාවට පැහැදිලි කර දුන්නේය. එතුමාගේ ප්‍රතිපත්තිවල වටිනාකමත්, ඒ අනුව අන්ධකාරයේ සිටින ජනතාවට ආලෝකය නැවත වරක් ලබා ගත හැකි බවත් පන්ද දයකයන්ට පෙනීගියේය.

## ඉඩම් විකුණයි

මැතිවරණයට අවශ්‍ය [illegible] ලබාගැනීමට එතුමාට තරමක ප්‍රහේලිකාවක් විය. මැතිවරණ කා[illegible]ය් එදිනෙද වියදමට අවශ්‍ය මුදල් ටික පවා සොයා ගැනීම අපහසු කරුණක් විය. බණ්ඩාරනායක මහතාට තම පියාගෙන් උරුමවූ ඉඩකඩම් ටිකකින් ලැබෙන ආදයම හැර තමන් සතුවූ විශාල ධනස්කන්ධයක් නොවිය. 1952 මැතිවරණය සඳහා දරන ලද වියදම්වල ණය ගෙවීම සඳහා තමාට පියාගෙන් උරුමවූ කුඩා ඉඩම් සියල්ලම සහ විශාල ඉඩමක් ද විකිණීමට සිදු විය.

1956 මැතිවරණය වන විට උග්‍ර මුදල් හිගයකින් පෙලුන එතුමා මැතිවරණ වියදම් සඳහා තමාගේ අපේක්ෂකයින් අතර බෙදදීමට මුදල් ලබා ගැනීම සඳහා ස්වකීය පියාගෙන් උරුමව තමා පදිංචිව සිටි රොස්මඩ් පෙදෙසේ නිවස සහ ඉඩම බැංකුවට උකස් කර මුදල් ටිකක් ලබා ගැනීමට සූදනම්වූ අවස්ථාවේ ඒ බව ආණ්ඩුවේ බලධරයන්ට දැනගන්නට ලැබුනෙත් එය ද වලක්වන ලදී. එයින් පසුබට නොවූ එතුමා වෙනත් මාර්ගයකින් ණයට මුදල් ටිකක් ලබාගෙන මැතිවරණය මෙහෙය වූයේ ඉතා අමාරුවෙනි. මොන මොන බාධක මධ්‍යයේ වුවත් තමන්ගේ ජාතිය වෙනුවෙන් ඕනෑම දෙයක් පරිත්‍යාග කිරීමට එතුමා නිතරම සූදනමින් සිටියේය.

ජන බලයෙන් ඌනතාවයක් නැති එතුමා විසින් 1956 මහා මැතිවරණය ට ඉදිරිපත් කරන ලද අපේක්ෂකයන් 60 දෙනාගෙන් 51 දෙනෙක්ම විශිෂ්ඨ ලෙස ජයග්‍රහණය කල අතර අපේක්ෂකයන් 76 දෙනෙක් ඉදිරිපත් කළ එක්සත් ජාතික පක්ෂයට දිනාගත හැකි වූයේ අසන 8ක් පමණි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන මහජන එක්සත් පෙරමුණ සමග නිතරග ගිවිසුමකට බැදී සිටි. ලංකා සමසමාජ පක්ෂය අසන 14 ජයග්‍රහණය කළෙන් එවර පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායක පදවිය පවා එක්සත් ජාතික පක්ෂයට අහිමි විය.

ලංකාවේ මෑත දේශපාලන ඉතිහාසයේ පළමුවරට සංස්කෘතික අමත්‍යාංශයක් ඇතිකර්ම, සිංහල ජාතික භාෂාව බවට පත්කිරීම, ස්වදේශීය වෛද්‍ය ක්‍රමයට නියම ස්ථානය ලබාදීම, අධිරාජ්‍ය නම්බු නාම නැතිකිරීම, ගමනාගමන හා වරාය ජනසතු කිරීම, කටුනායක හා ත්‍රිකුණාමලයේ යුද කඳවුරු පවරා ගැනීම දස අවුරුදු සැලැස්මක් සකස් කර ආදායම් බදු ක්‍රමය සැකැසීම, කුඹුරු පනත පැනවීම, විශ්ව විද්‍යාල පුළුල් කිරීම, ආදී ඉතා වැදගත් පියවරවල් රාශියක් මෙම රජය විසින් ගනු ලැබිය.

නිලධාරී පැලැන්තියේ සහ පොලිසියේ තර්ජන හා හිංසාවන්ගෙන් මිදුන සමාන්‍ය ජනතාව නිදහස් සෙවරි මිනිසුන් ලෙස හිය එසවූයෙන් "**අපේ ආණ්ඩුව**" යැයි ඔවුන් විසින්ම හඳුන්වනු ලැබිය.

මැයි දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත්කර සේවක අර්ථසාධක අරමුදල හා කම්කරු විනිශ්චය මණ්ඩල ඇතිකර ධනපතින්ගේ ගසා කෑම් වලින් කම්කරුවෝ නිදහස් කර ගැනීමට පියවර ගනු ලැබිය. පර්ලිමේන්තුවේ තිබූ නියෝජිත ආසන, 95, 151, දක්වා වැඩිකර පර්ලිමේනතුව වඩා පුලුල් මහජන තත්වයක් ඇතිකිරීම සහ වයස 18 තරුණ පිරිසට චන්ද බලය පවරා දීම ආදී වැදගත් පියවරවල් ද ගන්නා ලද්දේ එතුමා විසිණි. බණ්ඩාරනායක මැතිතුමා මරා දැමීමට ඔවුන් සමත් වුවත් එතුමා අනුගමනය කළ වටිනා ප්‍රතිපත්ති හා එතුමාගේ ප්‍රතිබිම්බය ජනතාවගේ හද තුලින් මකා දැමීමට නොහැකි විය. ජාතියේ සෞභාග්‍ය සඳහා එතුමා විසින් ආරම්භ කරන ලද නමුත් එතුමාගේ කනගාටු දායක හදිසි අභාවය නිසා නිම කිරීමට නොහැකි වූ වැඩ කොටස ජනතාවගේ නාමයෙන් මා වෙත පවරා ගැනීමට සිදුවූයේ පක්ෂයේ මාර්ගදේශකත්වය සඳහා ජනතාවටද පිළිගත හැකි වෙනත් නායකයෙක් නොසිටි නිසාය.

**මේ රටේ වෙන කිසිවෙකුට වඩා කිට්ටුවෙන් අවුරුදු 20 ක් එතුමා ආශ්‍රය කිරීමේ භාග්‍යය ලබා සටි මට එතුමා විසින් ජනතාවට ලබාදීමට ප්‍රයත්න දරණ ලද පරමාර්ථයන් සහ සේවාවන් ගැන නියම අවබෝධයන් තිබෙන බවද ජනතාවගේ මතය විය. එතුමාගේ එකම අපේක්ෂාව වූ මහජන සුබ සිද්ධියට අදළ කටයුතු එතුමා වෙනුවෙන් මුදුන් පත් කිරීමේ දැඩි අධිෂ්ඨානයක් මා තුළ උද්ගත විය. ජනතාවගේ මෙම ඉල්ලීම ඉවත දැමීමට මට කිසිසේත් කළ නොහැකිවූ නිසා මොන අන්දමේ දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් වත් එය ජනතාව වෙනුවෙන් ඉටු කිරීමට මම එකඟ වීමි.**

## ලෝකයේ ප්‍රථම අගමැතිණිය

පාරම්පරික සිරිත් විරිත් අනුව ගම්බද පැරණි පවුලක නිශ්චල පරිසරයක් යටතේ ගැහැණු දරුවෙකු වශයෙන් හැදුණු වැඩුණු නමුත් ජාතියත් ජන්ම භූමියත් වෙනුවෙන් දේශපාලන පොර පිටියට බැස ජනතා සේවයට ඇප කැපවීමේ යුතුකම සහ හැකියාව මට තිබෙන නිසාම මාගේ ජාතිය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය භාරගෙන 1960 ජුලි මැතිවරණ සටන මෙහෙයවීමට ඉදිරිපත් වීමි. මෙම මැතිවරණය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් කරන ලද අපේක්ෂකයන් 98 දෙනාගෙන් 75 දෙනෙක්ම ජයග්‍රහණය කළ අතර අපේක්ෂකයන් 128 දෙනෙක් ඉදිරිපත් කළ එක්සත් ජාතික පක්ෂයට දිනාගත හැකි වුයේ ආසන 30 ක් පමණකි. මා එම මැතිවරණයේදී ආසනයක් තරග නොකළත් වැඩි ආසන ගණනක් ගිම් පක්ෂයේ නායිකාව වශයෙන් ආණ්ඩුවක් පිහිටුවන ලෙස ලද ආරාධනාව ජනතාව වෙනුවෙන් පිළිගෙන **ලෝකයේ පළමුවන අග්‍රමාත්‍ය වරිය වීමේ ඓතිහාසික ගෞරවයද අපේ දිවයිනට ලබාදුනිමි.**



අග්‍රාමාත්‍යධුරය භාරගැනීමට රජගෙදරට ...............
ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමා සමග අනුර පුතු

ජනතාව විසින් මා වෙත පවරන ලද වැඩ සියල්ල සම්පූර්ණයෙන්ම නිම කිරීම සඳහා නොයෙක් අන්දමේ බාධක මධ්‍යයේ මහත් පරිශ්‍රමයෙන් කටයුතු කිරීමට සිදුවිය. ඒවායේ ප්‍රතිඵල දැන් ජනතාව භුක්ති විඳිනවා දැකීම මාගේ ප්‍රීතියට කරුණකි. ක්‍රමයෙන් හිස එසවීමට පටන් ගත් ප්‍රතිගාමී බලවේග මැඩලීම සහ දේශපාලන වශයෙන් පූර්ණ බලතල සහිත පෙඩරල් වාදයක් සඳහා රට බෙදීමට තැත්කළ කාණ්ඩායම් වලට මම අවස්ථාවක් නුදුන්නෙමි.

**තෙල් ජනසතුව**

විදේශීය වෙළඳ බලවේගයක් ඒකාධිකාරයක්ව තිබූ ඉන්ධන ගෙන්වීම සහ බෙදා හැරීම, ඔවුන්ගෙන් පැහැර ගෙන ජාතිය වෙත පැවරුවෙමි. ඒ සමගම තෙල් සඳහා වියදම් වන විදේශ විනිමය රැක ගැනීමේ අපේක්ෂාවෙන් ලාභ ජල විදුලිය වැඩි වැඩියෙන් නිපදවීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

1956 මෙන්ම ප්‍රගතිශීලී කණ්ඩායම් එකම අරමුණක් ගෙන ඉදිරියට යාම අනිවාර්යයෙන්ම සිදු විය යුත්තක් නිසා 1964 මුල් භාගයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධානත්වයෙන් යුත් සභාග ආණ්ඩුවක් පිහිටුවා ගත්තෙමු.

කාලාන්තරයක් තිස්සේම අපට මුහුණ දීමට සිදුව තිබුණ ඉතා බැරෑරුම් ප්‍රශ්නවලින් එකක් වන ඉන්දියානු ප්‍රශ්න දෙරටේම අනුමැතිය ඇතිව සාධාරණ අන්දමින් විසඳීමට හැකි විය. විදේශ සම්මේලන කීපයක දී සහ ඉන්දු - චීන දේශ සීමා අර්බුදයේදී අප ගත් ක්‍රියා මාර්ග අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සහ එමගින් මුළු මහත් දිවයිනට ගෞරවයක් ලබා ගැනීමට හැකි වූයේය.

## ලොව පළමු විරුද්ධ පක්ෂයේ නායිකාව

උත්තර මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රී වරයෙකු වශයෙන් මෙතෙක් සිටි මමද 1965 මාර්තු මැතිවරණයේදී අත්තනගල්ල ආසනය වෙනුවෙන් ඉදිරිපත් වී වාර්තා ගත වැඩි ඡන්ද ගනණකින් ජයග්‍රහණය කර මෙතෙක් මා මහජන නියෝජිතයෙක් නොවේ යැයි කී කණ්ඩායම් දුර්මුඛ කරමින් **ලෝකයේ පළමුවන විරුද්ධ පක්ෂයේ නායිකාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් බිහි කිරීමේ ගෞරවයද ලබාදුනිමි.**

### විශිෂ්ඨ ජයග්‍රහණය

කෙසේ වුවත් අවුරුදු පහක පාලනයෙන් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. ඒ අවුරුදු පහ තිස්සේම ජනතාව රැවටීමට දැරූ ප්‍රයත්නයෙන් රැවටුනේ ජනතාව නොව එක්සත් ජාතික පක්ෂය බව මැතිවර ප්‍රතිඵලවලින් පැහැදිළිව පෙනී යයි. 1970 මැයි මස 27 වන දින පවත්වන ලද මැතිවරණයේදී ආසන 128 ක් සඳහා අපේක්ෂකයන් ඉදිරිපත් කළ ආණ්ඩු බලයද තිබූ එක්සත් ජාතික පක්ෂයට දිනා ගැනීමට හැකි වුයේ ආසන 17 ක් පමණි. ආසන 106 ක් තරග කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 91 ක් ජය ගත් අතර ලංකා සමසමාජ පක්ෂයේ අපේක්ෂකයෝ 19 දෙනෙක්ද, කොමියුනිස්ට් පක්ෂයේ අපේක්ෂකයන් 06 දෙනෙක් ද, ජනතාව විසින් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට තෝරා යවනු ලැබීය.

මෙම මැතිවරණයේ විශේෂ ලක්ෂණයක් වූයේ ඩඩ්ලි සේනානායක මහතා ගේ ඇමති මණ්ඩලයේ ඇමතිවරුන් 04 දෙනෙක් හැර සෙසු හැම දෙනාම පරාජයට පත් වීමයි. එමෙන්ම ඉකුත් පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සිටි ශ්‍රී ලංකා නිදහස් පාක්ෂික මන්ත්‍රීවරුන් අතුරෙන් කිසිවෙක් පරාජය කිරීමට ඩඩ්ලි සේනානායක මහතාට නොහැකි විය.

## ජනරජය

මාගේ සභාපතිත්වයෙන් යුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධානත්වයෙන් 1970 මැයි මස අවසානයේදී පිහිටුවන ලද රජය මගින් මෙතෙක් කරන ලද ජාතික ව්‍යාපාර ගැන දීර්ඝ විස්තරයක් කිරීමට අදහස් නොකරමි. යල් පැනපු ව්‍යවස්ථාව වෙනුවට රටට සහ කාලයට ගැලපෙන ව්‍යවස්ථා මාලාවක් අනුව ස්වෛරී සමුහාණ්ඩුවක් පිහිටුවීම පිළිබඳ මූලික කටයුතු දැන් අවසාන වේගන යයි.
මෙතෙක් විදේශික කොම්පැණි සතුව තිබූ වරායේ තෙල් සම්පාදනය ජාතියට පවරා දුන්නෙමි. රැකිරක්ෂා විරහිතව සිටි උපාධිධාරීන් අතුරෙන් 7000 පමණ දෙනාට රැකියාවන් ලබාදී ඔවුන්ද ජාතික සංවර්ධනයේ කොටස් කරුවන් කර ගත්තෙමු. නිකරුණේ ඉවත යන මිනිස් ශ්‍රමය ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල මගින් ඵලදායී රටේ පොදු ශුභ සිද්ධිය සඳහා යෙදවීමට පියවර ගත්තෙමු. මේ රටේ ජනතාව ප්‍රගතිශීලී රජයක් පිහිටුවා ගත් සෑම අවස්ථාවකදීම එම රජයට විරුද්ධව භයානක කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙලක් පැන නැගුණු බව දක්නට ලැබේ.
1959 අගමැති ඝාතනය, 1962 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණය, 1964 රාජ්‍ය පෙරළීමේ කුමන්ත්‍රණය සහ 1970 ත්‍රස්තවාදී කැරැල්ල මෙයට නිදසුන් වශයෙන් දැක්විය හැක.
එහෙත් ජාතික සෞභාග්‍ය සඳහා අප ඉතා ආදරයෙන් සහ ගෞරවයෙන් පවත්වාගෙන යන ප්‍රගතිශීලී වැඩ කොටස කුමන්ත්‍රණකාරී අතළොස්සට විනාශ කිරීමට මේ රටේ ප්‍රගතිශීලී පොදු ජනතාව ඉඩ නොතබන බව මම තරයේ විශ්වාස කරමි.

ඉදිරියෙහි කොපමණ බාධක තිබුණත් ජාතිය වෙනුවෙන් පරිත්‍යාගශීලීව ඒවා විඳ දරාගනිමින් ජාතියේත් ජන්මභූමියේත් අපගේ ආගම ධර්මයේත් හා අපට උරුම සංස්කෘතියේ පුනර්ජීවනය සහ ජීවත්වන පරම්පරාවේ සහ මතු උපදින පරම්පරා ගණනාවකට සෞභාග්‍ය උදාකරදීමේ පරිශුද්ධ චේතනාවෙන් දිවංගත බන්ඩාරනායක මැතිතුමා විසින් ආරම්භ කරන ලද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රගතිශීලී ව්‍යාපාර ගෙනයාමේ කොටස්කරුවන් වීමෙන් වැඩිකල් නොගොස්ම සෞභාග්‍යවත් ශ්‍රී ලංකාවක් ගොඩ නැගිය හැකි බව අපගේ ඒකාන්ත විශ්වාසය වන්නේය.

## ඇති නැති පරතරය

1971 ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ඇරඹීම නිමිත්තෙන් '**ඇති නැති පරතරය නැතිකරමු**'මැයෙන් ගරු **අග්‍රාමාත්‍යතුමිය නිකුත් කරන ලද පණිවිඩය ඉතා වැදගත්ය.** එතුමියගේ සම්‍යක් සංකල්පනාවන් එයින් මොනවට පිළිබිඹුවේ. අපි එම අදහස් විමසිල්ලෙන් අධ්‍යයනය කරමු. ගතවූ කාලය තුළ මේ රටේ සංවර්ධනය සඳහා නියමාකාරව සකස් වූ සැලැස්මක් නොතිබුණි. එය මේ රටේ සංවර්ධනය සඳහා බලවත් බාධාවක් විය. සැලැස්මක් නොතිබුණ නිසාම රැකිරක්ෂා ප්‍රශ්නය ද උග්‍රවීම පුදුමයක් නොවේ. මේ කරුණු ගැන සළකා බැලූ මගේ අමාත්‍යාංශය මේ කරුණු කීපය එක්වර සම්පූර්ණකරලීම සඳහා රටට ඉදිරිපත් කර ඇති ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙල ඉතා වැඩදයක ක්‍රියාමාර්ගයක් ලෙස සැලකිය හැකිය.

දැනට දිවයින පුරා අරඹා ඇති හයසීයකට අසන්න ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගම්බද රැකිරක්ෂා ප්‍රශ්නයට එක්තරා විසඳුමක් වී ඇත. රටේ සංවර්ධනයට හේතුවන ලෙස මෙම රැකියා පැනය විසඳීමට නම් රැකියා ගැන මේ රටේ ඇති සාමාජික ආකල්පය වෙනස් කළ යුතුව ඇති බව මගේ හැඟීමයි.
කර්යාලයක සිට කරන ලිපිකරු වැඩකින් පමණක් රැකියා විසඳීමක් හෝ රටේ සංවර්ධනයක් බලාපොරොත්තු විය නොහැක. මෙම ප්‍රාදේශය සංවර්ධන මණ්ඩලවල ආකාර කීපයකම වැදගත් කම් රැඳී තිබේ.
මෙතෙක් මෙම රටේ ක්‍රම සම්පාදනයත් එය ක්‍රියාත්මක කිරීමත් භාර වී තිබුනේ නිලධාරින් අතොලොස්සක් දෙනාටය. එහෙත් මෙමගින් ගම්බද පොදු ජනතාවට එම සැලසුම් සකස් කිරීමත් පැවරී ඇත.
මේ රටේ විශාල වශයෙන් යම් යම් කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යය තිබෙන නමුදු ඒවා ක්‍රමානුකූලව වැඩට යොද ගැනිමට කිසිවෙක් කල්පනා කර තිබුනේ නැත.

එහෙත් මින් පසු එම අමු ද්‍රව්‍යයත් ගම්බද ජනතාවගේ අපතේ යන ශ්‍රමයත් එක් කළ විට අපට සෑහෙන තරම් බලාපොරොත්තු කරා ළඟාවෙන්නට හැකි බව මට විශ්වාසයි.

මෙම සංවර්ධන මණ්ඩල මගින් කාර්මික මෙන්ම කෘෂිකාර්මික වැඩ පිළිවෙලවල් ආරම්භ කිරීමට පුළුවන. අපේ රට කුඩා රටක්. කර්මාන්ත වලින් පමණක් මේ රට සමෘද්ධිමත් කිරීමට නොහැකියි. සෑහෙන දුරට කෘෂිකර්මාන්තයත් දියුණුකළ යුතුයි. එමගින් රටේ සංවර්ධනයක් බලාපොරොත්තු වීම වැදගති.

අවුරුදු පහක් තිස්සේ ගොඩ ගැසී තිබුණ උපාධිධාරී ප්‍රශ්නය තරමක් දුරට හෝ නිරාකරණය කිරීමට හැකි වන අයුරු උපාධිධාරී සංවර්ධන සහයකයන් ලෙස අපි ජ ජ මණ්ඩල සඳහා පත් කළෙමු. ඔවුන් දැනට දක්වා ඇති උනන්දුව ප්‍රශංසනීයයි. තරුණයන් ලෙස ඔවුන් වෙත පැවරී ඇත්තේ විශාල වග කීමක් බව ඔවුන් මේ වන විටත් අවබෝධ කර ගෙන ඇතුවාට සැකයක් නැහැ.

මේ වැඩ පිළිවෙල යටතේ තම රටට සේවයක් කිරීමට ඔවුන්ට අවස්ථාවක් සැළසී ඇති අතර, තරුණ ශ්‍රමය මෙබඳු වැදගත් කාර්‍යයකට යෙදවීමට අවස්ථාවක් ලබා දී තිබේ. බොහෝ තරුණ කොටස් වල ඉල්ලීමක් තිබුණා ඔවුන්ට වැඩ කර පෙන්වන්නට අවස්ථාවක් ලබා දෙන ලෙස. මෙමගින් ඔවුන්ට එම අවස්ථාව සැළසී ඇති බව අවබෝධ වී ඇතුවාට සැක නැහැ. ඇති නැති පරතරය අත් බෝම්බ වලින් හෝ තුවක්කු වලින් නැති කිරීමට සිතීම නිරර්ථක ප්‍රයත්නයක් බව අපේ තරුණ පිරිස්වලට අවබෝධ විය යුත්තක්. ඇති නැති පරතරය නැති කිරීම සැලැස්මක් මගින් කළ යුත්තකි. මෙම සංවර්ධන මණ්ඩල සඳහා රජයෙන් රුපියල් කෝටි 10 යක් පමණ වෙන් කර තිබේ. එවිට එක් සංවර්ධන මණ්ඩලයකට රුපියල් දෙලක්ෂයක පමණ මූලික මුදලක් ලැබිය යුතුය. එමගින් සෑහෙන වැඩ කොටසක් ආරම්භ කර පවත්වා ගෙන යා හැක. මේ රට සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කිරීමත්, එය ක්‍රියාත්මක කිරීමත් තමුන්නාන්සේලා අප හැම දෙනකුටම අයත් කාර්‍යයක් බව අවබෝධ කර ගත යුතුයි.



ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රථම අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය මහනුවර ශ්‍රී දළදා මැඳුර අබියස ඓතිහාසික මහමළුවේ සිට ජාතිය අමතන අයුරු

## ජන රජය උදා කළ ජන බලය

අභිමානවත් ජාතියක් වශයෙන් තමන්ට ආඩම්බර විය හැකි, එසේම ස්වකීය උදාරතම අපේක්ෂාවන් පිළිබිඹු කරන අතර අනාගත පරම්පරාවන්ගේ ශුභ සිද්ධිය හා සන්තුෂ්ඨියට මග හෙළි කරණ, තමන් විසින්ම සකස් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇතිකර ගැනීමට අපගේ ජනතාව තුළ පවත්නා මහත් ආශාව ඔවුන් එකහෙළා පළ කළහ. යනුවෙන්. 1970 ජූලි මාසයේදී ආන්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය කැඳවමින් අගමැති සිරිමාවෝ බන්ඩාරණායක මැතිණිය කළ ප්‍රකාශයෙන් එතුමිය මුළු මහත් ජාතියේ ම අදහස පැවසුවාය. එතුමිය මෙසේද ප්‍රකාශ කළහ. අද දින පෞද්ගලිකව මට ඇති ප්‍රීතිය ප්‍රකාශ කිරීමට මට අවසරනම්, තමන් අගමැතිව සිටියදී ශ්‍රී ලංකාව ස්වාධීන සමාජවාදී ජනරජයක් බවට පත් කිරීමේ අරමුණින් ක්‍රියා කළ මගේ ස්වාමි පුරුෂයාණන් වූ දිවංගත, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ පරමාධ්‍යාශයන් ගෙන් එකක් මුදුන් පත් කරළීම සඳහා කටයුතු ඇරඹීමට මට හැකිවීම ගැන මම ආඩම්බර වන බව නිහතමානීත්වයෙන් යුතුව කියනු කැමැත්තෙමි.

බ්‍රිතාන්‍යයෙන් ලංකාවට ඩොමිනියන් තත්වය ඉල්ලන යෝජනාව ප්‍රථම වරට 1942 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කළේ දිවංගත, ඉතා කිට්ටු දේශපාලන සගයකු වුත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවීමෙහිලා එතුමා සමග මුල්ව ක්‍රියා කළාවුත් ජ. පී. ජයසූරිය මහත්මයයි. මන්ත්‍රණ සභාවේදී ඒකජන්දයෙන් සම්මත වූ එම යෝජනාවට එයින් පසු මෙරට ඇතිවූ සෑම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයකම පදනම බවට පත්විය.

ශ්‍රී ලංකාවට නව ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇතිකිරීමට අදහස් කරන නිදහස් ලංකා කෙටුම්පත් පනත රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරමින් නැවත 1945 ජනවාරි මාසයේදී ද බණ්ඩාරනායක මැතිතුමා මෙසේ ප්‍රකාශ කළේය. 1931 සිට මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වැඩ කිරීමෙන්ද වර්තමාන රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ආයු කාලය මුළුල්ලේම ඇමතිවරයකු වශයෙන් සිටීමෙන්ද පසු මා එළඹ සිටින නිගමනය නම් අප මුහුණ පා සිටින ප්‍රධාන ප්‍රශ්ණය වූ ජනතාව සඳහා සාධාරණ ජීවන තත්ත්වයක් ඇති කිරීමට නම්, ඒ පිළිබඳව අපට අවශ්‍ය සම්පූර්ණ බලතල නැතිව එම කටයුත්ත කවදාවත් කළ නොහැකි බවය.

නිදහස් ලංකා කෙටුම්පත් පනත යටත් විජිත භාර මහා ලේකම්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදුව, සෝල්බරි කොමිසම ලක්දිවට අවුත් සාක්ෂි විභාග කරගෙන යද්දී, 1945 ජූලි මාසයේදී බණ්ඩාරනායක මහතා මෙසේ රට සිය විරුද්ධත්වය පළකළේය. පනත මේ සභාවට ඉදිරිපත් කිරීම වූ කල්හි, හුදෙක් මේ රටේ ව්‍යවස්ථාදායක මණ්ඩලය විසින් තම අවශ්‍යතා සඳහා ඉතා සුදුසු යයි තමන්ට හැඟී ගිය ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම සාකච්ඡා කිරීමට හා නිශ්චය කිරීමට තමන්ට අයිතිය තහවුරු කිරීමක් වන අතර මෙම මණ්ඩලය විසින් ඒ කාර්යය කරන ලද්දේ ඒ කාලයේදී කරනු ලැබෙමින් පැවති සෝල්බරි කොමිසමේ සාක්ෂි විභාගයට සමාන්තර කාර්යයක් වශයෙනි. මේ කෙටුම් පත් පනත ප්‍රතික්ෂේප කිරීම යටකී අයිතිය ප්‍රතික්ෂේප කිරීමකි.

1951 දී රජයෙන් ඉල්ලා අස්වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටවූ බණ්ඩාරනායක මහතා එම පක්ෂයේ නායකයා ලෙස නිකුත් කළ ප්‍රථම මැතිවරණ ප්‍රකාශයෙන් සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිදහස් ප්‍රජාතන්ත්‍ර වාදී ජනතාවකගේ ප්‍රාර්ථනා වලට හා අවශ්‍යතාවලට නොසරිලන බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ විදේශීය ප්‍රතිපත්තිය අපරට ජනතාවකගේ නියම යහපතට වඩා බ්‍රිතාන්‍යයේ සහ ඇමරිකාවේ අධිරාජ්‍යවාදීන්ගේ යහපතට හේතුවනසේ සකස් කරනු ලැබ ඇති බවත් ප්‍රකාශ කළේය.

ලන්ඩනයේදී පොදු රාජ්‍ය මණ්ඩල ප්‍රවෘත්තිලේඛක මණ්ඩලය අමතා කථා කළ එතුමා **එංගලන්තයේ මහා රැජිණ ඉඳුරාම උත්තම කාන්තාවක් බවත්, බ්‍රිතාන්‍ය කෙරෙහි හෝ එතුමිය කෙරහි ලක්වැසියන් වූ අප සිත් තුල ද්වේශයක් හෝ වෛරයක් හෝ නොමැති බවත්,** එසේ වුවද ජන රජයක් අප රටටත් අපගේ ආණ්ඩුක්‍රමයට වඩා උචිත යැයි අප සලකන බවත් ප්‍රකාශ කළේය. අපි බොහෝ ඈතක වෙසෙමු. අපගේ පෞද්ගලික සම්බන්ධතා ඉතා අල්පය. ඒ නිසා මහ රැජිණ කෙරෙහි ඔබ තුළ ඇති පෞද්ගලික බැඳීම අප තුළ ඇතිවිය නොහැකිය යි එතුමා වැඩි දුරටත් පැවැසිය.

බ්‍රිතාන්‍ය සමග යුද ගිවිසුමකට බැඳීමට ලංකාව කැමතිවීම නිසා මෙරට විදේශ ප්‍රතිපත්තිය බ්‍රිතාන්‍යට යටත්වීමෙන් සීමාසහිත බවට පත් ඩොමිනියන් තත්වයට අඩු ආණ්ඩුක්‍රම තත්ත්වයක් බ්‍රිතාන්‍ය විසින් ලංකාවට පැවරීමට විරුද්ධව පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් එතුමා ගෙනගිය උද්ඝෝෂණයට අනුකූලව ක්‍රියාකළ එතුමා, 1957 දී පොදු ජන ප්‍රීති ඝෝෂාව මැද්දේ කටුනායක හා ත්‍රිකුණාමලයේ පිහිටි බ්‍රිතාන්‍ය යුධ කඳවුරු පවරාගෙන, දස වසරකට කිට්ටු කලක් මුළුල්ලේ මෙරට පැවැති ඊනියා නිදහස ට යම් කිසි තේරුමක් අත්කර දුන්නේය.

1957 නොවැම්බර් මාසයේදී සෙසු කරුණු අතර පහත සඳහන් කරුණුවලට විශේෂ අවධානය දෙමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිශෝධනය කිරීම සඳහා බණ්ඩාරනායක මහතා උභය මන්ත්‍රී සභාවල ඒකාබද්ධ කාරක සභාවක් පිහිටුවන ලදී.

**1. ජනරජයක් පිහිටුවීම**

**2. මූලික අයිතිවාසිකම් ප්‍රදානය**

**3. සැනේට් සභාවේ නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ පත්කළ මන්ත්‍රීන්ගේ තත්ත්වය**

**4. රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ අධිකරණ සේවා කොමිෂන්** සභාව

මෙම කාරක සභාව සකස් වූයේ සියළුම අංශ නියෝජනය වන අන්දමිනි. විවිධ දේශපාලන කොටස් වලින් සහ ආගමික කණ්ඩායම් වලින් ද එය සමන්විත විය.

විශේෂ කාරක සභාවට පැවැරුණු කාර්යභාරය අවසන්වීමට පෙර. බණ්ඩාරනායක මහතාගේ ඛේදජනක අභාවය සිදුවුයෙන් කලක් ඉකුත්වන තුරු ආන්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කටයුතු ඇණහිටීමට පත් විය.

1965 සිට 1970 අතර කාලසීමාවෙහි එක්සත් ජාතික පක්ෂයත් එහි සහාග පක්ෂත් රජය කරවද්දී ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව ඒකාබද්ධ විශේෂ කාරක සභාවක් පිහිටුවන ලද. නමුත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණි විසින් මෙහෙයවන ලද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය ඇතුළත් සමගි පෙරමුණින් සැදුම්ලත් විපක්ෂය ඒ කාරක සභාවට සහභාගී නොවුයේය. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සකස් වන පාර්ලිමේන්තුව ස්වෛරීනොවන බව සක්සුදක්සේ පැහැදිළි වී තිබුණු නිසා, රටටත් ජනතාවටත් වහාම අවශ්‍යව ඇත්තේ එහෙන් මෙහෙන් එම ආන්ඩුක්‍රමයේ කඩතොලු වැසීමක් නොවන බව සමගි පෙරමුණ තථ්‍ය ලෙසත්, ස්ථිරසාර ලෙසත් වටහාගෙන සිටීම මීට හේතුවයි. පාර්ලිමේන්තුවේ එකමතික තිරණයකින් පවා ඉවත් කළ නොහැකි. 'පැලපැදියම් වගන්ති' මෙම ආණ්ඩුක්‍රමයට ඇතුළත්ව ඇති බව බ්‍රිතාන්‍ය රාජාධිකරණය තිරණය කළේය. අපගේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද ඉතා වැදගත් නඩු තින්දු ගණනක්ම ඇපැලේ දී රාජාධිකරණය විසින් ආන්ඩුක්‍රම ව්‍යවස්ථාමය කරුණු මත ප්‍රතික්ෂේප කරන ලදී.

අපගේ නිදහස පිළිබඳව පැවති මේ සම්බාදක දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ ජීවිත කාලය තුළ බ්‍රිතාන්‍ය රාජාධිකරණය මගින් තබා මෙරට උසාවියක් මගින් හෝ හෙළිදරව් කරන ලද නම් එතුමා එද කරන්නට තැත් කළ පරිදි ලන්ඩන් නුවර දී සකස් කෙරුණු ආණ්ඩුක්‍රමයට පිළියම් කරනු වෙනුවට ගෙයක් ගෙයක් පාසා ගොස් මේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් වළට සරිලන්නා වූද. ඔවුන්ට වචනයේ පරිසමජතයෙන් නිදහස හා ස්වාධීනත්වය ලබා දෙන්නා වූද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා සැම පුරවැසියෙකුගෙන් ම වරය ඉල්ලා සිටින ප්‍රථම පුද්ගලයා එතුමා බව පුන පුනා කීම අනවශ්‍යය. විදේශ ආධිපත්‍යය පිළිබඳ අන්තිම බැම්මෙන් සිය ජනතාව මුදවා ගැනිම සඳහා තම දිවංගත සැමියාණන් අරඹන ලද සටන නොනවත්වා කරගෙන යාමේ පාරිශුද්ධ කාර්යභාරය දෛවය විසින් බණ්ඩාරනායක මැතිණිය වෙත පවරනු ලැබිය.

තම නායිකාව වූ බණ්ඩාරනායක මැතිණියගේ මග දැක්වීම යටතේ සමගි පෙරමුණ විපක්ෂ්යේ සිටි අවුරුදු පහ තුළ කරන ලද ප්‍රාරම්භක කටයුතු කොතෙක්දැයි බොහෝ දෙනා හරිහැටි නොදන්නවා විය හැකිය. රාජ්‍ය කටයුතු පිළිබඳ සැම කාර්‍යයක්ෂෙත්‍රයකම, එතුමිය ඒ සඳහා ඇපකැප වූ පුදගලයන්ගෙන් කමිටු හා අධ්‍යාපන කණ්ඩායම් පිහිටවුවාය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එහි මිත්‍ර පක්ෂ වන ලංකා සමසමාජ පක්ෂයට හා කොමියුනිස්ට් පක්ෂයටද අයත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම සමන්විත වූ මේ අය විවිධ වෘත්ති, විශ්ව විද්‍යාල, වෘත්තීය සමිති ආදියට අයත් වූවාය. ඔවුන්ට මාර්ගෝපදේශකත්වය දුන් සමගි පෙරමුණේ විවිධ නායකයන්ගෙන් වැඩි දෙනා අද අමාත්‍ය මණ්ඩලයේ සමාජිකයෝ වෙති.

**1968 බෝගම්බරදී පැවැත්වුණු මහා රැලියේදී පක්ෂ තුන විසින් පිළිගන්නා ලද පොදු වැඩ සටහනකින් මෙසේ කියවේ.**

**ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයක් පිහිටුවන ලබන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ක්‍රියාවේ යොදවනු ඇත. මේ නව ව්‍යවස්ථාව ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ප්‍රජාතන්ත්‍ර සමාජයක් වෙනුවෙන් කැපවුනු නිදහස්, ස්වෛරී ස්වාධීන ජන රජයක් බව ප්‍රකාශයට පත් කරනු ඇත. සියළුම රටවැසියන්ගේ මූලික අයිතිවාසිකම් එයින් සහතික කරනු ඇත.**

මැතිවරණ ප්‍රකාශනයේ අඩංගු දේශපාලනමය වශයෙන් ඉතා වැදගත් ප්‍රකාශය වන මේ මැතිවරණයේදී ඔබ පත් කරන මන්ත්‍රීන් හට, අපේ රටට නව ව්‍යවස්ථාවක් සකස් කොට, සම්මත කොට ක්‍රියාත්මක කිරීමට හැකි ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් ලෙසින් ක්‍රියාකාරී වීමේ වරමද ඔබේ ජන්දයෙන් පවරන ලෙස අපි ඉල්ලා සිටිමු. යන නව ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවට නිත්‍යනුකූල වලංගුභාවය ලබා දුන් පාඨය ඇතුලත් කරන ලද්දේ 1969 මාර්තු 6 වන දින හොරගොල්ලේදී පැවැත්වුණු සමගි පෙරමුණේ නායක සමුළුවේදී බණ්ඩාරනායක මැතිණිය විසින් කරන ලද කාලෝචිත අවධාණය නිසා බව මෙහිලා සඳහන් කළ යුතුම කරුණකි.

1970 දී ලබාගත් ජනතා ජයග්‍රහණයෙන් සමගි පෙරමුණ පැතූ වරම නිශ්චිත ලෙසම තහවුරු කරන ලදී. එබැවින් 1970 ජූලි මාසයේදී ආන්ඩුක්‍රම සම්පාදක මන්ඩලය අරඹනු ලැබීය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුදු මහත් සැම විධිවිධානයක්ම මාස ගණනක් මුලුල්ලේ ප්‍රසිද්ධ රැස්වීම් වලදී. වේදිකාවල් වලදී ද. එමන්ම පුවත් මගින්ද සාකච්ඡාවට භාජනය කරනු ලැබීය. ජනතාවගේ සැම අංශයක්ම තමන්ගේ ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කර ගැනීමෙහිලා පරිසමාප්ත වශයෙන්ද සහභාගී වූ බව මෙයින් පෙනී යයි.

අන් සැම කරුණක්ම අභිබවා ගිය උසස්ම ප්‍රමුඛතාවයක් අගමැතිතුමිය විසින් තමන් බලයේ සිටි පසුගිය ඇවුරුදු කාලසීමාව මුළුල්ලේ ම නව ආන්ඩු ක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ කටයුතු වලට දෙන ලදී. කොතරම් කුඩා ජන කොට්ඨාශයකට වුවද, අගමැතිතුමියගේ පෞද්ගලික අවධානය සඳහා ඉදිරිපත් කළ යුතු යයි ඔවුන්ට හැඟී ගිය සෑම අදහසකටම කන්දීමට දිවා රෑ නොබලා දවස මුළුල්ලේ ම එතුමිය සැදී පැහැදී සිටියාය. ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කෙටුම් පත් කිපයක්ම වගන්තියෙන් වගන්තිය ඉතා සුපරික්ෂාකාරී ලෙස විමර්ශනයට භාජනය කරමින්, බලගතු වැදගත් කමකින් යුත් ඇතැම් තීරණ වලට එළඹීමට එතුමිය දුන් නායකත්වය, යුක්ති සදරනත්වයෙන් සහ සෑම පුරවැසියාගේම සුරක්ෂිතභාවය පදනම් කර ගත් සමාජවාදී ප්‍රජාතන්ත්‍රයක් උදකරණ ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවක් රටට දීම සඳහා එතුමිය දැක් වූ ආත්ම පරිත්‍යාගශීලි අභිරුචිය හා කැපවීම විදහා දක්වයි. ජනපරම්පරාවන් තෑජතියට පත්කරලීමට පමණක් නොව අපගේ ක්‍රියාවන්ගෙන් සමෘද්ධියට මාවත හෙළිකරලීමට ද එතුමිය ඒ සමගම නැහහොත් ඊට ද වැඩි සැළකිල්ලක් දැක්වූවාය.

නොබැඳි රටවල රාජ්‍ය නායකයන්ගේ පළමුවන සමුළුව 1961 සැප්තැම්බර් පළවනද සිට 6 වෙනද තෙක් යුගොස්ලෝවියාවේ අගනුවර වන බෙල්ග්‍රේඩ් හි පැවැත්විණ. එම සමුළුවට සාමාජික රටවල් 25 ක් නියෝජනත්වයෙන් ද නිරීක්ෂකයන් තුන් දෙනෙක් ද සහභාගී වූහ. ශ්‍රී ලංකාව නියෝජනය කරනු ලැබුවේ මෙම සමුළුවේ එකම රාජ්‍ය නායිකාව වූ සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය විසින්ය.

ශ්‍රී ලංකාවේ නියෝජිත වරිය වශයෙන් පමණක් නොව කාන්තාවක් හැටියටත් සිය දූදරුවන් වන මිනිස් වර්ගයා නව යුද්ධයක කාල තුවක්කු උණ්ඩ බවට පත් නොකර ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව සලකන මෙලොව ලක්ෂ ගණන් මව්වරුන්ගේ හැඟීම් දන්නා මවක් හැටියටත් තමා කතා කරන බව සමුළුව අමතමින් අගමැතිනිය කියා සිටියාය. බෙල්ග්‍රේඩ් හි පැවැති මෙම නොබැඳි සමුළුවේ දී අන්තර් ජාතික වශයෙන් නොබැඳි පිළිවෙත ඉදිරියට ගෙන යන්නට අගමැතිණිය සමත් වූයේ සියළු රටවල ප්‍රසාදය දිනාගනිමිනි.



බණ්ඩාරනායක ජනපතින් ආදරණීය දරුවන් සමග
ශ්‍රී ජවහල් ලාල් නේරුතුමා සහ දුවණිය

## ජයග්‍රහණ

අමෙරිකානු හත්වෙනි නාවික හමුදව ලංකා මුහුදු සීමාව ඉක්මවා පැමිණෙන්නට අවසර ඉල්ලූ අවස්ථාවේ බණ්ඩාරනායක මැතිණිය එය ප්‍රතික්ෂේප කළේ රටේ ස්වාධීනත්වයත්, නොබැදි විදෙස් පිළිවෙතත් දැඩි ලෙස ආරක්ෂා කරමිනි. එපමණක් නොව ඉනිදියානු සාගරයේ ඇමෙරිකානු හත්වෙනි නාවික හමුදව රදවා තැබීම ගැන එතුමිය තදබල විරෝධය පළකර සිටියාය.

අගමැතිණිය අනුගමණය කළ ශ්‍රේෂ්ඨ නොබැදි ප්‍රතිපත්තියේ ප්‍රතිඵල ලොවට ප්‍රකට කෙරෙන සිද්ධියක් 1962 දී සිදු විය.
ඉන්දියාව හා චීනය අතර ඇතිවූ දේශ සීමා අරගලයේදී පක්ෂග්‍රාහී නොවූ අගමැතිණිය එය සාමකාමී ලෙස බේරුම් කිරීමට ඉදිරිපත් වූවාය. එම ප්‍රශ්නය සාමය කතා බහ මගින් විසදීම සදහා මං සෙවීම පිණිස නොබැදි රටවල් හයක නායකයෝ අගමැතිණියගේ ආරාධනය පරිදි කොළඹදී රැස් වූහ.

කාම්බෝජය, බුරුමය, ඉන්දුනීසියාව, ඝානාව, එක්සත් අරාබි ජනරජය හා ලංකාව එම රටවල් හය විය. මෙම සමුළුවේ යෝජනාව ඉන්දියාවට ත් චීනයටත් ගෙන යාමේ සම දූතිකාව ලෙස එකමතික අනුමැතිය පරිදි ක්‍රියා කළේද අපේ අගමැතිණියයි. එතුමියගේ ප්‍රයත්නය නිසා චීන-ඉන්දීය අර්ගලය දිග්ගැස්සෙන්නේ නැතුව සාමකාමී තත්වයකට පත්විය.
ඇඩි මිත්‍රතාවයත් නොබැඳි විදේශ පිළිවෙතත් නිසා ඉන්දු ලංකා ප්‍රශ්නය විසඳ ලන්නට බණ්ඩාරනායක මැතිණිය සමත්විය. දීර්ඝ කාලයක් තිස්සේ විසඳිය නොහැකිව පැවැති ඉන්දු - ලංකා ප්‍රශ්නය හා කච්චදූව පිළිබඳ ප්‍රශ්නය විසඳීමෙන් අගමැතිණිය ලැබූ ජයග්‍රහණය නොබැඳි සංකල්පයේ නිවැරැදි බව හුවා දක්වයි.
නොබැඳි සමුළුව 1964 දී දෙවන වරටත් කයිරෝ නුවරදී පැවැත්විණි. කයිරෝ සමුළුවට රටවල් 47 ක් සහභාගී විය. ශ්‍රී ලංකාව නියෝජනය කළේ බණ්ඩාරනායක අගමැතිණියයි.
නොබැඳි ජාතින්ගේ පස් වැනි මහ සමුළුව ශ්‍රී ලංකාවේ පවත්වන්නට නියම වීම නොබැඳි පිළිවෙත පිළිබඳව බණ්ඩාරනායක මැතිණිය පසුගිය පසළොස් වසර මුළුල්ලේ අනුගමනය කළ ක්‍රියා කලාපයේ විශිෂ්ඨ ජයග්‍රහණයක් බව කිව යුතුය.
නොබැඳි ජාතින්ගේ රාජ්‍ය නායක සිව්වන සමුළුව 1973 සැප්තැම්බර් මස 5 වන ද සිට 9 ද දක්වා ඇල්පීරියාවේ අගනුවර වන ඇල්ජියර්ස් හිදී පැවැත්විණ. මෙම සමුළුවට රටවල් 75 ක් සහභාගි වූ අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය සහභාගි වූවාය. ඉන්දියාව වෙනුවෙන් ඉන්දිරා ගාන්ධි මැතිණිය සහභාගි වූවාය.

## නොබැඳි රාජ්‍ය නායක හමුව ශ්‍රී ලංකාවේ

ලොවින් අඩක් නියෝජනය වූ ජාතීන් 86 කගේ පස්වන මහා සමුළුව 1976 අගෝස්තු මස 16 වෙනි දින ශ්‍රී ලංකාවේ පැවැත් විණ. එවකට හාරසිය කෝටියක් වූ ලෝක ජනතාවගෙන් එකසිය අනූ දෙකෝටියක ජනතාවක් නියෝජනය කරමින් නායක නායිකාවන් පිබිදෙන ලෝකයේ විමුක්ති සටන් මග තවතවත් අර්ථවත් කරමින් කොළඹදී රැස්වී අපේ අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය මුලාසනය ගෙන මුල් දෙසුම පැවැත්වූ වග ප්‍රීතියෙන් සදහන් කරමු.

## මගුල් බෙර

බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත් වූ උත්සවය ශ්‍රී ලංකාවේ පෞරාණික සංස්කෘතික අංග ලොවට විදහා දක්වන අවස්ථාවක් ද විය. අපේ මංගල අවස්ථා සංකේතවත් කෙරෙන මගුල් බෙර හඬ සහ සක් හඬ මධ්‍යයේ ශ්‍රී ලංකා ජනාධිපති විලියම් ගොපල්ලව උතුමාණන් සහ සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණිය රාජ්‍ය නායකයන් සමග අසුන් ගැනිමට රැස්වීම් ශාලාවේ වේදිකාවට පිවිසෙන මොහොතද ජනාධිපතිවරයා විසින් චාරිත්‍රානුකූලව පහන් දල්වා රාජ්‍ය නායක මහා සමුළුව විවෘත කරනු ලබන අවස්ථාව ද ලොව පුරා වෙසෙන කෝටි සංඛ්‍යාත ජනතාවකට රූපවාහිනී මගින් එවෙලේම දැක ගැනිමට හැකිවිය.



සිරිමාවෝ ස්වකීය මිතුරිය ඉන්දිරා ගාන්ධි මැතිණිය සමග

**ශ්‍රද්ධාභක්තිය**

දඹදිව බුද්ධගයාවෙන් අතිගරු ජනාධිපතිණියට පරිත්‍යාග කරන ලද ජයශ්‍රීමහාබෝධි බීජාංකුරය **අනුරාධපුර ශ්‍රී මහ බෝමළුවේ රෝපණය කිරීම නිමිත්තෙන් 1997 අප්‍රියෙල් විසිවන දින සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමිය විසින් නිකුත්කරන ලද පණිවිඩය එතුමියගේ ශ්‍රද්ධාභක්තිය විදහාපාන කැඩපතක් වැන්න.**

අප බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලබන අවස්ථාවේදී පිටදුන් බුද්ධගයාවේ ශ්‍රීමහාබෝධියේ දකුණු ශාඛාව ධර්මාශෝක අධිරාජයාණන්ගේ දියණිය වූ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවීමෙන් අප රටේ බුදුසස්න පිහිටුවීමෙහිලා මෙන්ම විවිධ ශිල්පීය ක්‍රමවලද විශාල දියුණුවක් ඇතිවිය. මෙයට වසර 2200 කට පූර්වයේදී රෝපණය කරන ලස මෙම ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ බෞද්ධ ජනතාවගේ අතිමහත් වූ ගෞරවයට පාත්‍රවී ඇත. බෞද්ධ ජනතාව මෙතුවක් කල් එය ආරක්ෂා කර ගනිමින් වැඳුම් පිදුම් කළ බවට අඛන්ඩ ලිඛිත ඉතිහාසයක් ද තිබේ. ඉපැරණිම වෘක්ෂය ලෙසද ශ්‍රීමහාබෝධීන් වහන්සේ සඳහන් වේ. දේවානම්පියතිස්ස රජ සමයේ සිටම ශ්‍රී මහාබෝධීන් වහන්සේ ආරක්ෂා කර ගැනිමට අපගේ පැරණි රජදරුවන් මෙන්ම වර්තමානයේදී රාජ්‍ය අවධානය ද හැමවිටම යොමුවී තිබේ.



කෘතවේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය, විද්‍යාවේදී, කැලණි රාජමහා විහාරාධිපති, නලේවෙල විජිත ධම්මරක්ඛිත නාහිමි අපවත්වීම සැළවූ වහාම කැලණි රාජමහා විහාරස්ථානයට සම්ප්‍රාප්තව ශ්‍රී දේහයට ගෞරවාචාර දැක්වීම............වත්මන් විහරාධිපති, ආචාර්‍ය, කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමිපාණන්ද වැඩසිටී.

**ශ්‍රද්ධාභක්තිය**

දඹදිව බුද්ධගයාවෙන් අතිගරු ජනාධිපතිණියට පරිත්‍යාග කරන ලද ජයශ්‍රීමහාබෝධි බීජාංකුරය **අනුරාධපුර ශ්‍රී මහ බෝමළුවේ රෝපණය කිරීම නිමිත්තෙන් 1997 අප්‍රියෙල් විසිවන දින සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමිය විසින් නිකුත්කරන ලද පණිවිඩය එතුමියගේ ශ්‍රද්ධාභක්තිය විදහාපාන කැඩපතක් වැන්න.**

අප බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලබන අවස්ථාවේදී පිටදුන් බුද්ධගයාවේ ශ්‍රීමහාබෝධියේ දකුණු ශාඛාව ධර්මාශෝක අධිරාජයාණන්ගේ දියණිය වූ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවීමෙන් අප රටේ බුදුසස්න පිහිටුවීමෙහිලා මෙන්ම විවිධ ශිල්පීය ක්‍රමවලද විශාල දියුණුවක් ඇතිවිය. මෙයට වසර 2200 කට පූර්වයේදී රෝපණය කරන ලස මෙම ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ බෞද්ධ ජනතාවගේ අතිමහත් වූ ගෞරවයට පාත්‍රවී ඇත. බෞද්ධ ජනතාව මෙතුවක් කල් එය ආරක්ෂා කර ගනිමින් වැඳුම් පිදුම් කළ බවට අඛන්ඩ ලිඛිත ඉතිහාසයක් ද තිබේ. ඉපැරණිම වෘක්ෂය ලෙසද ශ්‍රීමහාබෝධීන් වහන්සේ සඳහන් වේ. දේවානම්පියතිස්ස රජ සමයේ සිටම ශ්‍රී මහාබෝධීන් වහන්සේ ආරක්ෂා කර ගැනිමට අපගේ පැරණි රජදරුවන් මෙන්ම වර්තමානයේදී රාජ්‍ය අවධානය ද හැම්විටම යොමුවී තිබේ.



කෘතවේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය, විද්‍යාවේදී, කැලණි රාජමහා විහාරාධිපති, නලේවෙල විජිත ධම්මරක්ඛිත නාහිමි අපවත්වීම සැළවූ වහාම කැලණි රාජමහා විහාරස්ථානයට සම්ප්‍රාප්තව ශ්‍රී දේහයට ගෞරවාචාර දැක්වීම...........වත්මන් විහරාධිපති, ආචාර්ය, කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමිපාණන්ද වැඩසිටි.

ජයශ්‍රී මහ බෝධීන් වහන්සේ ගිලන්වූ අවස්ථාවේදී කලට වේලාවට නිසි පිළියම් කිරීමද සිදුවිය. මෙම අවස්ථාවේදී බුද්ධගයාවේ ශ්‍රී මහා බෝධි අංකුරයක් යළිත් ජයශ්‍රී මහා බෝමළුවේම රෝපණය කිරීමට අවස්ථාවක් සැළසීම සමස්ථ බෞද්ධ ජනතාවගේම ඉමහත් සැළකිල්ලට යොමුවිය යුතු කරුණකි. මන්ද වසර දෙදහස් ගණනකට පසුව සිදුකරනු ලබන මෙම ඓතිහාසික අවස්ථාව ඉතිහාසගත වන බැවිනි. එමෙන්ම අප රජය පවතින කාලයේදී මෙවැන්නක් සිදුකිරීමට අවස්ථාව ලැබීම ගැන අතිශයින් සතුටුවෙමි. මේ උතුම්වූ කටයුත්ත අතිගරු ජනාධිපතිතුමිය අතින් සිදුවන මොහොත ගෞරවයෙන් සිහිපත් කළ යුතු අවස්ථාවක් වේ. අපි සියළු දෙනාම මෙම සුවිශේෂ අවස්ථාව බුද්ධාලම්බන ප්‍රීතියෙන් යුතුව සමරමු.
ඔබ සියළු දෙනාටම තෙරුවන් සරණයි.
**ශ්‍රී ලංකාවාසීන්ට නව වසරේ ශුභ පතමින්** 1997 දෙසැම්බර් 31 වෙනිදින වර්ෂාවසානය එතුමිය ගතකළේ කතරගමය. එදින සන්ධ්‍යාභාගයේ කිරි වෙහෙර අබියස විශේෂ පුණ්‍යකර්මයකට සහභාගිවූ එතුමිය පසුදින එනම් නව වසරේ පළමුදින කතරගම මහදෙවොලේ විශේෂ පූජාවකටද සහභාගි වූවාය.

## ගුණගරුක භාවය

එතරම් දුරබැහැර ප්‍රාග්මික කටයුත්තකට අයහපත් සෞඛ්‍ය තත්වය මත වුවත් සහභාගිවූ එතුමිය පසුදින එනම් ජනවාරි මස තෙවෙනිදින තම සමකාලිනයෙකු වූ අභාවප්‍රාප්ත බර්නාර්ඩ් සොයිසා අමාත්‍යතුමාගේ අවමංගල උත්සවයට ද සහභාගි වූවාය.

## උදාරත්වය

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ බෑණනුවන් වූ විජය කුමාරතුංග මහතා 1982 දී වැලිකඩ බන්ධනාගාරයේ රදවා සිටි අවස්ථාවේ ඔහු බැලීමට එතුමිය එහි ගියාය. එතුමිය බන්ධනාගාර අධිකාරි කාර්යාලයේදී විජය අත් අඩංගුවට ගත් ආකාරය පිළිබඳව කම්පා වූවාය. එසේ වුවත් බන්ධනාගාර අධිකාරී ඇමතූ එතුමිය ඔබ රජයේ සේවකයෙක් රජයේ නියෝග ක්‍රියාත්මක කිරීමට ඔබ බැඳී සිටිනවා යි කීවාය.
අපේ රටේ අග්‍රගණ්‍ය ජනතා නායකයෙකුගේ චින්තනය මතුකළ එතුමිය සිය උදාරත්වය හෙළි කළ බවද වාර්තා වී ඇත.



සැදැහැසිතින් තෙරුවන් නැමදීම

## අථිපූණි දේශනය

1997 දෙසැම්බර් මස 8 වෙනිදින අග්‍රාමාත්‍ය .සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය පාර්ලිමේන්තුව අමතා කල අථිපූණි දේශනය පාර්ලිමේන්තු මන්ත්‍රිවරු පවා සාවධානව ශ්‍රවනය කළ බව සඳහන් කළ යුතුය. බාධාවකින් තොරව කථානායකවරයාට හෝ කතාකළ නොහැකි පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යතුමිය දේශනය පවත්වන අවස්ථාවේ පැවැති නිශ්ශබ්දතාවය සහ විණය ගරුකත්වය එතුමියට ආණ්ඩු පක්ෂයෙන් මෙන්ම විපක්ෂයෙන්ද ගෞරවයක් නිතැතින්ම හිමිවන බව සංකේතවත් කිරීමකි. එම කතාව ඒ අයුරින්ම වාර්තාකර තැබීම අනාගත දරුවන්ට කළ හැකි සේවයකි. "දීර්ඝ කාලයකට පසු අයවැය විවාදයේදී විදේශ කටයුතු අමාත්‍යාංශය ගැන මා කතා කිරීමට තීරණය කළේ එය මගේ හදවතට බෙහෙවින් සමීප වූ කරුණක් නිසාය. අගමැති ධුරය කලින් දැරූ අවස්ථා දෙකේදී මම විදේශ ඇමති ධුරයේද කටයුතු කළෙමි.

1960 සිට 1965 දක්වාත් 1970 සිට 1977 දක්වාත් මා එම ධුරයේ කටයුතු කළ සමයේදී රටවල් විශාල සංඛ්‍යාවක් සමග ශක්තිමත් සබඳතාවයක් ඇතිකර ගත්තා. ඒ අතර නොබැඳි ජාතින්ගේ සමුළුවට අයත් රටවල් සුවිශේෂ ස්ථානයක් ගන්නවා. එම සබඳතා වලින් අප රටට පහසුකම් රැසක් ලැබිණි. එයින් සිරිමා - ශාස්ත්‍රි ගිවිසුම එක් උදාහරණයකි. එයින් නොබැඳි ගා සුහදතාවය යන කරුණු පෙන්නුම් කෙරිණ.

ඉන්දියාව හා සුහදතාවය ගොඩනැගුණු අතර ඒ තත්ත්වය ක්‍රමයෙන් පසුව වෙනස් විය. 17 අවුරුදු එ.ජා.ප. පාලන සමයේදී එම තත්වය උදවිය. එහි ප්‍රතිඵලයක් ලෙස අද අප සියළු දෙනාම උතුරු හා නැගෙනහිර යුද්ධයෙන් පීඩාවට ලක්වී සිටී. 1970 - 77 එක්සත් පෙරමුණු ආණ්ඩුව වඩාත් තහවුරු අන්දමින් විදේශ සබඳතා ගොඩනගා ගත්හ.
අප විදේශ සේවයට නුසුදුසු පුද්ගලයන් බඳවා ගත්තේ නැහැ. එහෙත් පසුගිය එ. ජ. ප. පාලනය 1977 න් පසු එවැනි නුසුදුසු පුද්ගලයන් තානාපතිවරුන් ලෙස ඉතා වැදගත් ස්ථානවලට පත් කළහ. එම නිසා එවැනි පුද්ගලයන්ට කොටි ත්‍රස්ථවාදීන්ගේ ප්‍රචාරක කටයුතු වලට එරෙහිව රජය වෙනුවෙන් කටයුතු කිරීමට හැකිවුයේ නැත.
අපේ තනාපතිවරුන්ට මේ චෝදනා එල්ල කළා. විදේශ සේවයේ වෘත්තිය තත්ත්වය නැති කළේ එ. ජා. ප. යයි.
ඒ තත්ත්වය නැති කිරීමට අපේ රජය කටයුතු කරගෙන යනවා. පිළිගැනීමක් ඇති විදේශ සේවයක් ඇති කිරීමට ඇමති තුමා කටයුතු කිරීමට කැමතිය. විදේශ සේවයේ හොඳ යහපත් තත්ත්වයක් ඇති කිරීමට හුගක් දේ සිදුකර ඇත. ඒ සඳහා විදේශ සේවයට සහභාගි වන අයට පුහුණු වීමේ ආයතනයක් අප බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ ශාලාවේ එකල පිහිටුවන ලදී. එයින් විශාල පිරිසක් පුහුණුව ලැබූ අතර ආචාර්ය වර්නන් මෙනඩිස් මහතා එහි අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස ක්ටයුතු කළා. ඔහු විදේශ අමාත්‍යාංශයේ නිලධාරින් සඳහා පුහුණු පාඨමාලා රැසක් පටන් ගත්තා. පුහුණු වන විදේශ සේවයේ අය මේ තුළින් හොඳ සේවයක් ලබා ගත්තා.
මේ ආයතනය මගින් දැන් පාඨමාලා පහක් පවත්වා ඇත. 1995 දී 65 ක් ද 1966 දී 128 ක්ද, 1997 දී 156 ක් ද මෙහි අධ්‍යාපනය හදරා පිටව ගොස් ඇත.
රට අමතරව තවත් 300 ක් තානාපති සබඳතා විණය ආදිය ගැන පුහුණු වක් ලබා තිබෙනවා.
1995 සිට විදේශ සේවයේ බඳවාගත් සියළු දෙනාම මෙම ආයතනයේ මාස 5ක් පුහුණුවක් ලබා ඇත. ජාත්‍යන්තර සබඳතා, වෘත්තිමය සබඳතා ලංකාවේ සංස්කෘතික කටයුතු ගැන මෙම නිලධාරීහු ලෝක ගම්මානයක එකට බැදී සිටිනවා. රජයේ ජාත්‍යන්තර කටයුතු වළදී ඔවුන් රජයේ අදහස් හා උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක කරනවා.
ඔවුන් ලංකාවේ වෙළඳ පොලට ආයෝජකයින් කැඳවාගෙන ඒමටත් කටයුතු කරනවා. අපේ රට ලෝකයේ හොඳ තත්ත්වයක් ඇති කරගැනීම සඳහා අපේ තානාපති සේවය කටයුතු කරන්න ඕනෑ.

රටට යහපතක් වන පරිදි විදේශ සේවය යොද ගත යුතුය. ඒ සඳහා හොඳ නිලධාරින් යොද ගත යුතු අතර විදේශ සේවය සඳහා යාබද ඉන්දියාවෙන් අපට බොහෝ පාඩම් ඉගෙන ගත හැකිය. ඉන්දියාවේ විදේශ සේවයෙන් අපට ඉගෙන ගත හැකි හොඳම පාඩම නම් ඉන්දිය රජය එරට විදේශ සේවය දේශපාලකයින් ගේ ඇඟිලි ගැසීම් වලින් තොරව පවත්වාගෙන යාමයි.

## ගෞරව දැක්වීම

ලෝක ජනනායක නායිකාවන් සහ දූත මෙහෙවරෙහි නිරතවුවන් ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත වන සෑම අවස්ථාවකදීම පාගේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය සමුව් සුහද කතාබහක යෙදී ගෞරව දැක්වීමට අමතක නොකරති. එතුමියට මිතුරු මිතුරියන් මිස සතුරු සතුරියන් නොමැත. නමුත් දේශපාලන වශයෙන් එතුමියට සතුරුකම් කළ පිරිස පවා අද වරද පිළිගෙන ඇත. පාක්ෂිකයන් මෙන්ම විපාක්ෂිකයන්ද අද එතුමියට කාරුණික සුහදතාවක් මෙන්ම අසීමිත ගෞරවයක් ද දක්වති. එම ගෞරව ලැබීමට එතුමිය එතරම්ම සුදුසු වන්නේ ය. එතරම්ම පුණ්‍යවන්ත වන්නේය.
මෙම කුඩා ග්‍රන්ථය සමාප්තියේදී එතුමියගේ 1998 නව වසරට ශුභ පැතුම් තුළින් කරුණු කිහිපයක් මතුකර දැක්වීම ඉතාමත් කාලෝචිතය.

## සාමය සඳහා කැපවෙමු

ලබන්නාවූ නව වසර සාමයේ වසර ලෙස සලකා අවබෝධයෙන් අධිෂ්ඨානයෙන් හා කැපවීමෙන් යුතුව කටයුතු කිරීමට සිතා ගනිමු. ශ්‍රී ලංකාව නිදහස් රටක් බවට පත්ව අඩසිය වසරක් සමරණ 1998 වසර ශ්‍රී ලාංකිකයන් වන අපට ඉතාමත් වැදගත් වසරක් වනවා නොඅනුමානය. ඉතාමත් බුද්ධිමත්ව ගැඹුරින් සිතා ප්‍රශ්න ජයගත යුතු වසරක් වශයෙන් 1998 අප කරා එළඹෙයි. පවත්නා කුරිරු යුද්ධය නිසා මේ වන විට ජීවිත දහස් ගණනක් අපට අහිමිව ඇත. විනාශ වූ දේපළ වත්කම් ප්‍රමාණයද සුළුපටු නොවේ. ලබන්නාවූ වසරේ සමස්ත ශ්‍රී ලාංකික ජනතාවගේම බලවත් අධිෂ්ඨානය විය යුත්තේ වත්මානයේදී අප මුහුණු පා සිටින මේ ව්‍යසණයන්ගෙන් මිදීමයි. නව වසරට එළඹීමේදී අප සැමදෙනාම තම ආගමානුකූලව ක්‍රියාවන්හි නිරත වෙමින් මානුෂික ගුණ දහමින් හා දයාවෙන් යුතුව සමස්ත මානව වර්ගයා වෙතම දැත් දිගුකිරීමයි. එසේම ජාති කුළ ආගම් වශයෙන් නොබෙදී එකම මවකගේ දරුවන් ලෙස ස්වභාවධර්මයා අපට නිර්මාණය කරදුන් මිහිතලයේ එක්වන්ව ජීවත් වෙමින් මෙම අධිෂ්ඨානය සපුරා ගැනීමට කටයුතු කිරීමයි. සියළුදෙනාටම නව අවුරුද්ද සියළුබාධක අවහිරතාවයන්ගෙන් මිදුන වාසනාවන්ත නව වසරක් වේවායි සියළුදෙනාම එක්වන්ව ප්‍රාර්ථනා කරමු.



නිදහස් ස්වර්ණ ජයන්ති උළලේදී සිරිමාවෝ අග්‍රාමාත්‍යතුමියට චාල්ස් කුමරු හෙළසිරිතට අනුව දෑත් එක්කොට ආයුබෝවන් කියයි.

## නිදහස් ස්වර්ණජයන්තිය

ශ්‍රී ලංකාව අධිරාජ්‍යවාදී බන්ධනයන්ගෙන් මුදගෙන පනස් වසරක් එළඹෙන නිදහස් ස්වර්ණජයන්තිය පසුගිය පෙබරවාරි මස 4 දින මහත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වුණා. දිවයින පුරා සතියක් මුළුල්ලේ පැවති විවිධ උත්සව නිදහස් සිතිවිලි තේමා කරගෙන තිබුණා. එවන් ස්වර්ණමය අවස්ථාවක ස්වර්ණමය ලෝක නායිකාවක් වූ ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිතුමියගේ සංකල්පනාවන්ගෙන් උපුටාගත් කරුණු කිහිපයක් සඳහන් කරනු කැමැත්තෙමි. තවද අයහපත් සෞඛ්‍ය තත්වය මධ්‍යයේ වුවත් එතුමිය පාර්ලිමේන්තු මන්දිරය අබියස පැවති නිදහස් ස්වර්ණජයන්ති ප්‍රධාන උළෙලේ ප්‍රධාන අමුත්තාවූ චාර්ල්ස් කුමරුන් සමග පැය දෙකකුත් විනාඩි විසිහයක් උත්සව පිය්යේ රැදී සිටිබව සඳහන් නොකරම බැරිය.

"අභිමානවත් ජාතියක් වශයෙන් නැගීසිටිමු

බ්‍රිතාන්‍ය යටතේ විජිත පාලනයෙන් නිදහස් ලබා අඩසිය වසරක් සපිරෙන මේ අවස්ථාවේදී ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපට සතුටට පත්විය හැකි කරුණු ගණනාවක්ම අපරථේද සිදුවී ඇත.

මෙහි මුල්තැනක් ගන්නේ යටත් විජිත පාලනයෙන් මිදුන බවට අප තුළ ඇතිවූ අභිමානවත් සිතිවිල්ලයි. එසේම අවුරුදු දහස් ගණනක් නිදහස් ජාතියක් වශයෙන් හිමිකරගෙන සිටි අපේ උරුමයන් වූ භාෂාවට, කලාවට, ආගමට හා පොදුවේ ගත්කළ අපේම සංස්කෘතියට නියිතැන ලැබීමයි. මේ නිසා අපගේ මෙකී සියලු කුසලතාවයන් හා වටිනාකම් ලෝකය තුළුවේ තබමින් ශ්‍රී ලංකාවට වැදගත් ස්ථානයක් ලබා ගැනීමට පසුගිය අඩසිය වසර තුළ අපට හැකිවිය.

ජනාධිපති ලේකම් කාර්යාලය
27 JUN 2000
පුස්තකාලය

## දැයේ මාතා

ලොව අපරටට කීර්තියක් ලැබී ඇත්තේ උදර නායකත්වය නිසාය. මෙතුමිය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම යුග කාන්තාවකි. උදර නායිකාවකි. එය ලක් ජනතාව සඳ ස්මරණීය කරනු ලැබේ. දිවියේ සන්ධ්‍යා සමය සමහරවිට කායිකව දුබල වුවත්, මානසිකව ධෛර්යවන්තය. විශේෂයෙන් මෙම වකවානුව තුළ සංස්කෘතික සංදර්ශන නැරඹීම කෙරෙහි රුචිකත්වයක් දැක්වූවාය. ජෝන් ද සිල්වා සමරු රඟහලේ දැයේ පබුදුව මතුකරවන සංස්කෘතික සංදර්ශන එතුමිය නැරඹුවේ මහත් චිත්තප්‍රීතියකිනි. සංස්කෘතික හා ආගමික කටයුතු ගරු අමාත්‍ය, ලක්ෂ්මන් ජයකොඩි මැතිතුමා එම අවස්ථාවන් එතුමියට උදකරවූයේ ගෞරවයෙනි. බොහෝකලක සිට එතුමිය කැලණි විහාරස්ථානයට පැමිණ විහාරාධිපතීන් වහන්සේ බැහැදැකීම සිරිතක්ව පවත්වාගෙන එනු ලැබීය. ඒ සැම අවස්තාවකදීම පාගේ මට ද සහභාගිවීමට අවස්ථාව ලැබිණ. එතුමියගේ පෞරුෂය කිසිවෙකුටත් සම කළ නොහැකිය. කථිකත්වයද එසෙම ය. සිංහල බස මෙන්ම ඉංග්‍රීසි බසද චතුරව හසුරවනු මම දැක ඇත්තෙමි. එම අවස්ථා අදත් මතකයේ පවතී. එතුමිය මිනිසත් බව හොඳහැටි හඳුනයි. එසේම මතකයේ රඳවා ගනී. කිසිවිටෙකත් ඔබ කව්දැයි අසන්නේ නැත. ඉතින් කොහොමද එතුමිය ප්‍රියශීලීව අමතයි. එතුමිය විරුද්ධ පක්ෂයේ සිටියදී පවා හිතෛශීන් සුරැකීමට ගත් පියවර අපට සදකල්හි මතකය.

දැයේ මාතාව ලෝක නායිකාවක් වීම දැයේ වාසනාවකි. එවැනි වාසනාවන්ත පුණ්‍යවන්ත මාතාවක් පිළිබඳ දේශයේ දරුවකු වශයෙන් බොහෝ දේ ලියන්නට හැකිය. එසේ ලිවීම මෙවැනි කුඩා පොතකින් කළ නොහැකිය. ඉතා වැදගත් යැයි මා සැළකූ අදහස් පමණක් ගොණුකර අතිශය ගෞරව හැඟීමකින් මෙම කටයුත්ත ඉටුකළේ හදවතේ දළුලා වැඩුණු "පූජාච පූජනීයානං" යන යෙදුමට සුළුවෙන් හෝ දයකවීම මගේ යුතුකම හා අරමුණ වශයෙන් සැළකූ නිසාමය. මෙය උදර ජීවිතයක පරිපූර්ණ චරිත කතාවක් නොවන්නේය. එසේවූවත් මහා ගුණ සමුදයක, පරිණත බුද්ධි මහිමයක ලොව ජයගත් ලොව පිළිගත් වීරෝධාර නායිකාවට දැයේ මාතා උපහාරයක්ම වේවා......

1948 දී ලබාගත් නිදහසෙහි පිබිදීමත් වඩාත් අර්ථවත් අයුරින් සිදුවූයේ 1956 දී බණ්ඩාරනායක මහතා ඇති කළ සමාජ පෙරළිය නිසාය. පසුකාලීනව මගේ රජය පැවැති 1972 වසරේදී, පළමුකොට ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී ජනරජයක් බවට පත්කිරීමට කටයුතු කිරීම නිසා එතෙක් විදේශ හා පැවැති අපේ සමහර බැඳීම් ද සම්පූර්ණයෙන්ම නැතිවිය.

එද නිදහස ලබාගැනීමට, ජාති ආගම් කුල වශයෙන් බෙදී නොසිට අපේ ජනනායකයෝ එක්වන්ව සටන් කළහ. එසේම නිදහසද ලබාගත්හ. නිදහස සමරණ මේ අවස්ථාවේදී අපෙන් සිදුව යම් යම් අඩුපාඩු වේ නම් ඒ සියල්ල ගැනද සිතා වරද නිවැරදි කරගත යුතුවේ. මෙහිදී එකමුතුකම හා ජාතික සමගිය වඩාත්ම වැදගත්ය. ශ්‍රී ලංකාවේ ජීවත්වන සියලුදෙනාම අන්‍යොන්‍ය බැඳීමකින් යුත් ශ්‍රී ලාංකිකයින් වශයෙන් සළකා යහපත් අනාගතයක්, අනාගත පරපුරට බිහිකිරීම එළඹෙන යුගයේදී අප විසින් ඉටුකළ යුතු වැදගත්ම කාර්යභාරය වශයෙන් සළකමි.

අඩසිය වසරක නිදහස සමරණ මේ මොහොතේදී මව්බිමේ ස්වාධීනත්වය හා නිදහස වෙනුවෙන් සටන් කළ ඉතිහාසයේ නම් සඳහන් කළාවූත් නොකළාවූත් සියලුම දේශප්‍රේමී ජාතික වීරවරයින් හා අපේ මුතුන් මිත්තන් ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරමු. එසේම වර්තමානයේදී යුද පෙරමුණේ සිට අප රටේ අයිතිය, නිදහස හා ආරක්ෂාව උදෙසා සටන් කරමින් ජීවිත කැප කළ දේශප්‍රේමී රණවිරුවන් සියලු දෙනාමද මෙහිදී ගෞරවයෙන් සිහිපත් කරමු.

තවද, අපේ ජාතික කොඩිය නිදහසේ සංකේතය බවට පත් කර ගැනීමට අධිෂ්ඨානපූර්වක හැඟිමෙන් කටයුතු කර එයට නිසි ගෞරවය ලබාදීමට හැමවිටම ක්‍රියාකරමු.

එසේම අභිමානවත් ජාතියක් වශයෙන් අපි අපේ ජාතික අනන්‍යතාවය ලෝකයා හමුවේ තබමු.

**ශෝක දිනයක් ලෙස ගතකරමු**

අතිපූජනීය දළදා මාළිගය අබියස 1998 ජනවාරි මස 25 දින අළුයම බෝම්බ පුපුරුවාලීමේ සිද්ධිය සැළවීමෙන් අතිශයින් ශෝකයට හා කම්පනයට පත්වූ සිරිමාවෝ මැතිණිය, ජනවාරි 31 ද ඒ වෙනුවෙන් ශෝක දිනයක් සේ සළකා කටයුතු කරන මෙන් බෞද්ධ ජනතාවගෙන් ඉල්ලා සිටි අතර එදින මාංශ ආහාරයෙන් හා මත්පැණින් වැළකී බැතිසිතින් ගත කරන ලෙසද ඉල්ලා සිටියාය.

ජනාධිපති ලේකම් කාර්යාලය
27 JUN 2000
පුස්තකාලය

**දැයේ මාතා**

ලොව අපරටට කීර්තියක් ලැබ් ඇත්තේ උදර නායකත්වය නිසාය. මෙතුමිය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම යුග කාන්තාවකි. උදර නායිකාවකි. එය ලක් ජනතාව සද ස්මරණීය කරනු ලැබේ. දිවියේ සන්ධ්‍යා සමය සමහරවිට කායිකව දුබල වුවත්, මානසිකව ධෛර්‍යජීවන්තය. විශේෂයෙන් මෙම වකවානුව තුළ සංස්කෘතික සංදර්ශන නැරඹීම කෙරෙහි රුචිකත්වයක් දැක්වූවාය. ජෝන් ද සිල්වා සමරු රඟහලේ දැයේ පබුදුව මතුකරවන සංස්කෘතික සංදර්ශන එතුමිය නැරඹුවේ මහත් චිත්තප්‍රීතියකිනි. සංස්කෘතික හා ආගමික කටයුතු ගරු අමාත්‍ය, ලක්ෂ්මන් ජයකොඩි මැතිතුමා එම අවස්ථාවන් එතුමියට උදකරවූයේ ගෞරවයෙනි. බොහෝකලක සිට එතුමිය කැලණි විහාරස්ථානයට පැමිණ විහාරාධිපතින් වහන්සේ බැහැදැකීම සිරිතක්ව පවත්වාගෙන එනු ලැබිය. ඒ සැම අවස්තාවකදීම පාගේ මට ද සහභාගිවීමට අවස්ථාව ලැබිණ. එතුමියගේ පෞරුෂය කිසිවෙකුටත් සම කළ නොහැකිය. කථිකත්වයද එසෙම ය. සිංහල බස මෙන්ම ඉංග්‍රීසි බසද චතුරව හසුරවනු මම දැක ඇත්තෙමි. එම අවස්ථා අදත් මතකයේ පවති. එතුමිය මිනිසත් බව හොඳහැටි හඳුනයි. එසේම මතකයේ රඳවා ගනී. කිසිවිටෙකත් ඔබ කව්දැයි අසන්නේ නැත. ඉතින් කොහොමද එතුමිය ප්‍රියශීලීව අමතයි. එතුමිය විරුද්ධ පක්ෂයේ සිටියදී පවා ගිහෙයින් සුරැකීමට ගත් පියවර අපට සදකල්හි මතකය.

දැයේ මාතාව ලෝක නායිකාවක් වීම දැයේ වාසනාවකි. එවැනි වාසනාවන්ත පුණ්‍යවන්ත මාතාවක් පිළිබඳ දේශයේ දරුවකු වශයෙන් බොහෝ දේ ලියන්නට හැකිය. එසේ ලිවීම මෙවැනි කුඩා පොතකින් කළ නොහැකිය. ඉතා වැදගත් යැයි මා සැළකූ අදහස් පමණක් ගොණුකර අභිගය ගෞරව හැගීමකින් මෙම කටයුත්ත ඉටුකළේ හදවතේ දළුලා වැඩුණු "පූජාච පූජනීයානං" යන යෙදුමට සුළුවෙන් හෝ දයකවීම මගේ යුතුකම හා අරමුණ වශයෙන් සැළකූ නිසාමය. මෙය උදර ජිවිතයක පරිපූර්ණ චරිත කතාවක් නොවන්නේය. එසේවුවත් මහා ගුණ සමුදයක, පරිණත බුද්ධි මහිමයක ලොව ජයගත් ලොව පිළිගත් විරෝධාර නායිකාවට දැයේ මාතා උපහාරයක්ම වේවා......

REFERENCE

**චිරං ජයතු............**

**දැයේ ප්‍රදීපය නිති දැල්වේවා**

රට දැය සමය නැගුමට පෙරමුනේ සිට
ලොව පූජිතව සිරිලක් මව අවදි කොට
ගෙල පළඳමින් දෙස්පාලන දිමුතු පොට
දැල්වෙන පහනක්ය මැතිණිය උපන් රට

ජනතා වරම් ලැබ අගමැති දූරය දැරූ
ජාතිය පුබුදු කළ මෙත් කරුණාව පිරූ
බබලන කිත් රැසින් සමවන නැගෙන හිරු
දියණිය ඔබයි අප ලක් මැණියගෙ ගරු

දූසනෙන් වන නාස්තිය පිටු දැකිමය
මදක් දුක්විඳ අනාගතයේ සැප විදීමය
පැතුම වූයේ දැයේ දියුණුව ඇති කිරීමය
රටේ යුතුකම දැයේ මාතා නිති රැකිමය

පුරවැසි කමට විණ කළවුන් වල් මත්වී
කළ පාපයෙන් උන් ඉහමොළ දැවී රත්වී
මෙහෙවර මහිමයෙන් ජනතාවට සෙත්වී
බොහෝ කල් විය ඔබ අගමිණ ලෙස පත්වී

මැතිසබේ හැසිරීම පිළිබඳ කියා දෙන් නට
ඔබ තුමිය සම වෙනත් අය නැත ඔවා ගන් නට
සමගි භාවය නැවත ලැබ රට දැය දිනන් නට
නිරෝගී සුව පතන්නෙමු අපි ආයුවන් නට

**සිරිමාවෝ රත්වත්තේ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමියට තෙරුවන් සරණින් ආයු බෝ වේවා**

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



ජනාධිපති කාර්යා...
පුස්තකා...



**දැයේ මාතා.......**

කතුවර, සාමවිනිසුරු,
පියසිරි පී. මීගොඩ

කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවත මධ්‍ය මහා විද්‍යාලයීය අධ්‍යාපනයෙන් පසුව, විශ්වවිද්‍යාල අධ්‍යාපනයට යොමු වුවත් සමගම බැංකු ක්ෂේත්‍රයට පිවිස තිස්පස් වසරක අඛණ්ඩ සේවයෙන් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙකු වශයෙන් විශ්‍රාම ලැබ, පොදු මෙහෙවරට අවතීර්ණව බියගම කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ බටහිර සියනෑ කෝරළේ විවාහ රෙජිස්ට්‍රාර් තනතුරෙහි සේවය කරයි.

ලේඛකයෙකු, කවියෙකු, ජනමාධ්‍ය වේදියෙකු හා දේශකයෙකු වශයෙන් නමක් දිනා ඇති ඔහු බොදු පිළිවෙත් අගයන පොදු මෙහෙවර සඳහා ස්වකීය දායකත්වය කැපකරනු ලැබේ. ඔහුගේ වෙනත් නිර්මාණ අතර,

ඇගේ මහිර
නිහඬ දියදහර,
ලක රූ ම කා ර යෝ
වරක් වැන්දෙත් කැලණියේ
අභියයින් ජනාදරයට පත්විය.

**දැයේ මාතා** ඔහු දැයට ලියූ චරිතාංග නිර්මාණයකි.

කැලණි සංස්කෘතික මණ්ඩලය



ISBN 955-96378-1-9

# දැයේ මාතා